2023

කාර්යය සාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report



රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

அரசாங்கத் தொழிற்சாலை திணைக்களம்

DEPARTMENT OF GOVERNMENT FACTORY

SLS ISO 9001:2008 QMS Certified Department

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය - 310

අන්තර්ගතය **පිටු අංක**


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය		02
1.1.	හැඳින්වීම	02
1.2	දෙපාර්තමේන්තුවේ දැක්ම,මෙහෙවර,අරමුණු	04
1.3	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්	05
1.4	තත්කාලීනව කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන කාර්යයන් හා ලබා දෙනු ලබන සේවාවන්	06
1.5	අප දෙපාර්තමේන්තුවේ සතුටුදායක සේවාලාභීන්	07
1.6	දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය	08
1.7	2023 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය හා විශේෂ සේවාවන්	09
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම		16
පරිච්ඡේදය 03 - වසරේ මූල්‍ය කාර්ය සාධනය		
3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	18
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	19
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	20
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	21
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	30
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය	30
3.7	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	30
3.8	විගණකාධිපතිවරයාගේ වාර්තාව	31
පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක		51
4.1	දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	51
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය		51
5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	51
5.2	තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	51
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ		52
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	52
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය / අතිරික්තයේ බලපෑම	52
6.3	ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වූ ආකාරය	53
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව		55
7.1	අභ්‍යන්තර විගණක වාර්තාව	61

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තුවක් වශයෙන් 1849 වර්ෂයේ කොළඹ ගෑස් වීදියේ ආරම්භ කරන ලද රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පසුකාලීනව එනම් 1928 වර්ෂයේ සිට කොලොන්නාව දෙමටගොඩ මාර්ගයේ ඛණිජ තෙල් සංකීර්ණය අසල පිහිටුවා ඇත.

ආරම්භක කාල සීමාවේදී මහා මාර්ග, පාලම්, වාරිමාර්ග, ගොඩනැගිලි ඉදිකිරීම් යනාදී යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායක වී ඇති අතර විදේශීය ඉංජිනේරුවන් විසින් මෙම ආයතනය මෙහෙයවා ඇත.



1969 දක්වා මෙලෙස ක්‍රියාත්මක වූ රජයේ වැඩ දෙපාර්තමේන්තුව එමගින් ඉටු කළ මහාමාර්ග තැනීම, නඩත්තුව සහ ගොඩනැගිලි ඉදිකිරීම සහ නඩත්තුව යනාදී සිවිල් ඉංජිනේරුමය කාර්යයන් සඳහා මහාමාර්ග දෙපාර්තමේන්තුව හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවද, යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම සඳහා "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ද, 1971.01.10 දින ස්ථාපනය කර ඇත.



බොල්ගොඩ පාලම ඉදිරිපස පෙනුම
1938 ජනවාරි 20

එතැන් සිට විවිධ රජයේ ආයතන මෙහෙයවීම සඳහා අවශ්‍ය වූ යාන්ත්‍රික ඉංජිනේරුමය සහායක සේවාවන් සැපයීම සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ අත්තිකාරම් ගිණුම් ක්‍රමයක් යටතේ පවත්වාගෙන යනු ලැබේ.



කාලානුරූපීව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් හා පොදු පහසුකම් අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ වර්තමානයේ **නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය** යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී.

මේ වන විට ශ්‍රී ලංකාව තුළ ජල කළමනාකරණ දියදොරටු නිර්මාණය කර සවි කිරීමේ වෙළඳපොලෙහි ප්‍රමුඛස්ථානය රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත හිමිව තිබේ. මෑතකදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නිම කරන ලද බොහෝ මහා පරිමාණ ජල ව්‍යාපෘතිවල ජල පාලන දියදොරටු සියල්ලම නිර්මාණය කර සවි කරන ලද්දේ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසිනි. වෙහෙරගල, දැදුරු ඔය, පේ ආරු, රාජාංගනය, තොණ්ඩමනාරු, අට්ටික්කාව සහ රඹකැන් ඔය ජලාශ ව්‍යාපෘතීන් මින් කිහිපයකි.

ඊට අමතරව පානීය ජලය ලබාදීම වෙනුවෙන් පිරිපහදු ටැංකි නිර්මාණය කර සවිකිරීම සිදු කරන ලදි.

රජයේ කර්මාන්තශාලාව විසින් යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ කරනු ලබන නිෂ්පාදන සහ සේවා ඉටු කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ කළවැඩ අත්තිකාරම් සහ ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය යටතේ වන බැවින් මෙම දෙපාර්තමේන්තුව රාජ්‍ය අංශයේ වාණිජ කටයුතු මෙහෙයවන සුවිශේෂී දෙපාර්තමේනතුවක් වශයෙන් හැඳින්විය හැක.

නිෂ්පාදන සහ නඩත්තු කාර්යයන් සඳහා යොදවනු ලබන දෙපාර්තමේන්තුගත නිලධාරීන්ට සහ සේවක පිරිස් සඳහා වැටුප් ගෙවීමට මාසිකව රුපියල් මිලියන 24ක මුදලක් පාරිභෝගිකයින්ගෙන් උපයා ගත යුතු වේ. මේ සඳහා මහා භාණ්ඩාගාරය විසින් අරමුදල් සපයනු නොලැබේ.

ශ්‍රී ලංකා ජාතික තත්ව ප්‍රතිපත්තිය අනුව යමින් 2013 වර්ෂයේදී රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ISO 9001:2008 ජාත්‍යන්තර තත්ත්ව පද්ධති සහතිකය දිනා ගැනීමට සමත් විය. මෙම සහතිකය උපයා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග තුලින් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීමට හැකි වූ අතර 2023 වර්ෂය තුලදී ISO 9001:2015 ජාත්‍යන්තර තත්ත්ව පද්ධති සහතිකය 2024 දක්වා යාවත්කාලීන කරන ලදී. ඊට අමතරව CIDA ආයතනයේ ඉදිකිරීම් වෙනුවෙන් EMI (Heavy Steel Fabrication) 2024 දක්වා අලුත් කරන ලදි. EMF (Elevators, Escalators & Revelators) 2024 දක්වා අලුත් කරන ලදි. SP2 Carpentry & Joinery) 2024 දක්වා අලුත් කරන ලදි. TVEC යටතේ වැද්දුම් ශිල්පය හා වාත්තු තාක්ෂණ පාඨමාලා සඳහා ලියාපදිංචි වීම. මේ මගින් අප විසින් ඉටු කරන පාරිභෝගික සේවා වල වර්ධනයක්ද ඇති කිරීමට හැකියාව ලැබී ඇත.



තෝප්පුව පාලම
1938 ඔක්තෝම්බර් 24



වැල්ලවත්ත පාලම
1939 අගෝස්තු 03

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

තිරසාර සංවර්ධනය තුලින්, ශ්‍රී ලාංකීය යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ නිෂ්පාදන, සේවා සහ පුහුණුව සපයන විශිෂ්ඨතම රාජ්‍ය ආයතනය බවට පත්වීම.

මෙහෙවර

“රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත, යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ වැඩ, නිෂ්පාදන, සේවා සහ උපදේශන සේවා සැපයීම. තාක්ෂණික ඉංජිනේරු ආධුනිකයින්, වෘත්තීය ඉංජිනේරුවරුන් වෙත, යාන්ත්‍රික වැඩ හා සේවා සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව ලබා දීම.”

1.3 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

(අ) නිෂ්පාදන ක්ෂේත්‍රය

රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් සඳහා ලෝහමය, දැවමය භාණ්ඩ නිර්මාණය හා නිෂ්පාදනය

1. වාරිමාර්ග ජල කළමනාකරණ දිය දොරටු හා උපකරණ, ආරෝග්‍යශාලා උපකරණ.
2. දැව ගෘහ භාණ්ඩ දැව භාණ්ඩ.
3. චීනච්චට්ටි හා නිපෙරස් වාත්තු.
4. පොලිස් දෙපාර්තමේන්තුව සඳහා නිල පටි, තරු, අංක තහඩු නිෂ්පාදනය කිරීම.
5. තැපැල් දෙපාර්තමේන්තුව හා වෙනත් දෙපාර්තමේන්තු සඳහා දින මුද්‍රා හා ඒ සඳහා අවශ්‍ය වන කැට නිෂ්පාදනය.
6. නාම පුවරු.

(ආ) ඉදිකිරීම් ක්ෂේත්‍රය (බර වැද්දුම්)

1. වාරිමාර්ග ජලාශ සඳහා විවිධ වර්ග වල ජල පාලන දිය දොරටු නිර්මාණය, නිෂ්පාදනය සහ සවි කිරීම.
2. පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති විහාරස්ථාන සහ බුද්ධ ප්‍රතිමා සඳහා ආරක්ෂක වැටවල් සහ ආරක්ෂිත වහල ඉදිකිරීම.
3. යකඩ සැකිළි මත ඉදි වූ ගොඩනැගිලි සෑදීම.
4. ගොඩනැගිලිවල දැව සහ ලෝහමය වහල ඉදි කිරීම.
5. රාජ්‍ය උත්සව, දේශිය හා විදේශිය රාජ්‍ය නායකයින්, විශේෂ ආරාධිත අමුත්තන් පිළිගන්නා උත්සව සඳහා හිරු ආවරණ, වේදිකා, කුටි ඉදි කිරීම.
6. යකඩ පාලම් ඉදිකිරීම.
7. ජල පවිත්‍රාගාර ටැංකි නිර්මාණය හා සවිකිරීම.

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

(ඇ) අලුත්වැඩියා සහ නඩත්තු ක්ෂේත්‍රය

1. ආරෝග්‍යශාලා, ආයුර්වේද, රෝහල්, බන්ධනාගාර, ලුහු කර්මාන්ත ආදී ආයතනවල යන්ත්‍රෝපකරණ නඩත්තුව හා අලුත්වැඩියාව.
2. වාරිමාර්ග හා ගොවිජනසේවා දෙපාර්තමේන්තු වල හා අනෙකුත් ආයතනවල ජල කළමනාකරණ දිය දොරටු සහ උපාංග නඩත්තුව හා අලුත්වැඩියාව.
3. කාර්යාල වල දැව භාණ්ඩ නඩත්තුව හා අලුත්වැඩියාව.
4. යතුරු ලියන හා වායු සමීකරණ යන්ත්‍ර නඩත්තුව හා අලුත්වැඩියාව.
5. රාජ්‍ය ආයතනවල වාහන සේවා කිරීම.

(ඈ) යාන්ත්‍රික ඉංජිනේරු උපදේශාත්මක සේවා

1. පශ්චාත් ඉංජිනේරු හා ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්, විවිධ පුහුණු ආයතනවල ආධුනිකයින් සඳහා ආයතනික ප්‍රායෝගික පුහුණුව ලබා දීම.
2. රාජ්‍ය ආයතනවල අලුත්වැඩියා කළ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා තත්ත්ව වාර්තා ලබා දීම.
3. රාජ්‍ය ආයතනවල තාක්ෂණික ඇගයීම් කමිටු, අපහරණ කමිටු හා තක්සේරු කමිටු සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
4. යාන්ත්‍රික ඉංජිනේරුමය නිෂ්පාදනය හා සේවා සහ උපදේශක සේවා සැපයීම.


1.4 තත්කාලීනව කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන කාර්යයන් හා ලබා දෙනු ලබන සේවාවන්

අංකය	ආයතනය	සපයනු ලබන සේවාවන්
01.	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	අරිය දිය දොරටු හා අනෙකුත් වීනවිවට්ටි, දැව හා යකඩ ජලනල දිය දොරටු හා උපාංග නිර්මාණය හා සවි කිරීම.
02.	රෝහල්	රෝහල් පවුඩර් කෝටින් කරන ලද හා සුදුයකඩින් නිෂ්පාදිත ගෘහ උපකරණ
03.	පොලිස් දෙපාර්තමේන්තුව/ ආරක්ෂක අමාත්‍යාංශය	නිල පටි, නාම පුවරු, යාන්ත්‍රික සයිරන් නලා, නිල අංක තහඩු ද්විත්ව ඇඳන්
04.	තැපැල් දෙපාර්තමේන්තුව	වර්ෂ, මාස හා දින කැට ඇතුළත් තැපැල් මුද්‍රා, ගෘහ උපකරණ, මෙවලම් නිෂ්පාදනය සහ යකඩ හා දැව ආශ්‍රිත නිමැවුම්
05.	දුම්රිය දෙපාර්තමේන්තුව	වාත්තු හා යකඩමය නිෂ්පාදනයන්
06.	පුනරුත්ථාපන/ ආයුර්වේද රෝහල්	යන්ත්‍රෝපකරණ සවි කිරීම සහ නඩත්තුව
07.	මාර්ග සංවර්ධන අධිකාරිය	මාර්ග බාධක හා සංඥා පුවරු, මෑන් හෝල් සැකිලි හා පියන්, යකඩ පාලම්
08	ජල සම්පාදන, ජල ප්‍රවාහන මණ්ඩලය	ජල පවිත්‍රාගාර ටැංකි ඉදිකිරීම / සවි කිරීම / අළුත්වැඩියාව
09.	මැනිවරණ දෙපාර්තමේන්තුව	ඡන්ද පෙට්ටි සැදීම, ගෘහ උපකරණ සැපයීම
10.	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	කාමර වෙන් කිරීම්, වහල අළුත්වැඩියා, වැසි අංක හා එන්ජින් අංක මුද්‍රණය
11	සියළුම රාජ්‍ය / පෞද්ගලික ආයතන	දැවමය ගෘහ භාණ්ඩ හා අනෙකුත් දැව නිෂ්පාදිතයන්
		ස්ක්‍රීන් මුද්‍රණ, ඩිජිටල් මුද්‍රණ, දැන්වීම් පුවරු, කැටයම් වැඩ, එනේග්වි (සැරිම)
		එම්බෝස් (ඉලිප්පුම් වැඩ) , රාජ්‍ය ලාංඡන
		දොර හා ජනෙල් නිෂ්පාදනය, බිත්ති පනේල (කැටයම්) කිරීම, පාටිෂන් කිරීම (ඇලුමිනියම් හා දැව)
		කැපීම, සිදුරු කිරීම, එතීම, හිල් විදීම (ඩ්‍රිල් කිරීම) වෑල්ඩින් සහ කම්මල් වැඩ, සියළුම යාන්ත්‍රන වැඩ Planing, CNC, Milling
		විශාල පිරිසැකසුම් වැඩ , සැහැල්ලු පිරිසැකසුම් වැඩ හා කම්මල් වැඩ හා ඇළුමිනියම් පිරිසැකසුම් වැඩ.
		විදුලි වැඩ, Control Panel Board නිර්මාණය හා සැදීම විදුලි ස්ථාපනයන් හා අලුත්වැඩියාවන්
		ඉලෙක්ට්‍රෝ ප්ලේටින් (විද්‍යුත් ලෝහාලේපනය) Powder coating කිරීම.
12.	වරලත් ඉංජිනේරු, ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්, විවිධ තාක්ෂණික පුහුණු ආයතන	යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රායෝගික පුහුණුව ලබාදීම

1.5 අප දෙපාර්තමේන්තුවේ සතුටුදායක සේවාලාභීන්

අංකය	ආයතනය	ලබා දුන් සේවාවන්
01	ක්‍රීඩා අමාත්‍යාංශය	දැවමය උළුවහු හා දොර ජනෙල් සෑදීම
02	මහා භාණ්ඩාගාරය	දැවමය උළුවහු හා දොර ජනෙල් සෑදීම
03	මැතිවරණ දෙපාර්තමේන්තුව	ඡන්ද පෙට්ටි සෑදීම, අළුත්වැඩියාව හා නාම පුවරු සැකසීම
04	ගල්ගූර් ගොඩනැගිල්ල - කොළඹ 01	දැවමය උළුවහු හා දොර ජනෙල් සෑදීම
05	ජනාධිපති මන්දිරය (අනුරාධපුර / නුවරඑළිය)	දැවමය උළුවහු දොර ජනෙල් සහ වහලය අළුත් වැඩියාව හා නඩත්තුව
06	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	ජල පාලන දිය දොරටු හා උපාංග සැලසුම් කිරීම, නිෂ්පාදනය නඩත්තුව හා අළුත්වැඩියා කිරීම.
07	රජයේ රෝහල්	සියළුම රෝහල් ගෘහ උපකරණ (යකඩ සහ සුදුයකඩ) පව්ඩර් කෝටින් කිරීම හා අළුත්වැඩියා කිරීම.
08	පොලිස් දෙපාර්තමේන්තුව	නිල පටි, අංක තහඩු ගෘහ උපකරණ, තට්ටු ඇඳන් (දැව හා යකඩ)
09	තැපැල් දෙපාර්තමේන්තුව	වර්ෂ, මාස හා දින කැට ඇතුළත් තැපැල් මුද්‍රා, ගෘහ උපකරණ හා මෙවලම්, නාම පුවරු නිෂ්පාදනය හා යකඩ සැකිලි මත ගොඩනැගිලි ඉදි කිරීම.
10	අධිකරණ අමාත්‍යාංශය	දැවමය ගෘහ භාණ්ඩ, ලේඛණාගාර රාක්ක, නාම පුවරු
11	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව/ මධ්‍යම සංස්කෘතික අරමුදල	පුරා වස්තූන් සඳහා යකඩ වහළ නිර්මාණය, සෑදීම, සවි කිරීම, නාම පුවරු, කෞතුකාගාර ගෘහ භාණ්ඩ නිෂපාදනය, වීදි ලාම්පු කනු සදා සවි කිරීම.
12	දුම්රිය දෙපාර්තමේන්තුව	තිරිංග පලු හා දුම්රිය සංඥා සඳහා අවශ්‍ය භාණ්ඩ / උපකරණ
13	විදේශ කටයුතු අමාත්‍යාංශය	යකඩ හා දැවමය භාණ්ඩ / උපකරණ නඩත්තු කටයුතු සිදු කිරීම හා අළුත්වැඩියා කිරීම
14	මාර්ග සංවර්ධන අධිකාරිය/ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය	යකඩ පාලම් සෑදීම සහ සවිකිරීම, නාම පුවරු සැදීම.
15	ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය	ජල පවිත්‍රාගාර ටැංකි නිර්මාණය, සෑදීම හා සවි කිරීම
16	ගුවන්තොටුපල හා ගුවන්සේවා සමාගම	Gantry පුටු Powder coart කිරීම, වීදුරු බිත්ති ආවරණය කිරීම සඳහා ආවරණ (Fender) සවි කිරීම.

1.6 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



ජෙ.යා.අ -	ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික අධිකාරී	ප්‍ර. සැ.ශි -	ප්‍රධාන සැලසුම් ශිල්පී	ජෙ.යා.අ.සැ -	ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික අධිකාරී (සැපයුම්)
සංව. නිල -	සංවර්ධන නිලධාරී	ජෙ.යා.අ.ආ -	ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික අධිකාරී (ආරක්ෂක)	යා.අධි -	යාන්ත්‍රික අධිකාරී
කා ග.ලිපි -	කාළගණක ලිපිකරු	පා.නි -	පාලන නිලධාරී	වැඩ.පරි -	වැඩ පරිපාලක
ප්‍ර.සම්.සහ -	ප්‍රමාණ සම්ක්ෂණ සහකාර	වැඩ.ලිපි -	වැඩහල ලිපිකරු	අ.වැ ස -	අයවැය සහකාර
කළ සේ නි -	කළමණාකරණ සේවා නිලධාරී	අර්.ශිල්පී -	අර්ධ ශිල්පී	සු.සා.නි -	සුභසාධක නිලධාරී
කා.කා.ස -	කාර්යාල කාර්ය සහායක	වැ.හ සහ -	වැඩහල සහකාර	තො.ස.තා.නි -	තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිලධාරී

1.7 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය (2023.12.31 දිනට) - කළ වැඩ අත්තිකාරම්

	ව්‍යාපෘති විස්තර	ඉලක්කය 2023		ප්‍රගතිය 2023	
		ඇස්තමේන්තුව (රු.මි.)	භෞතික(%)	පිරිවැය (රු.මි.)	භෞතික(%)
1	විදුලි, යාන්ත්‍රික යාන්ත්‍රන, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා නඩත්තු ඒකකය මගින් ඉටු කරන කාර්යයන්	08	100%	8.6	100%
2	බර පිරිසැකසුම් ඒකකය මඟින් ඉටු කරන අනෙකුත් කාර්යයන්.	192	100%	110.3	80%
3	යාන්ත්‍රික දැව ඉරීම සහ දැව භාණ්ඩ සෑදීමේ ඒකකය මගින් ඉටුකරන කාර්යයන්.	55	100%	36.4	60%
4	සැහැල්ලු පිරිසැකසුම් ඒකකය මඟින් ඉටු කරන කාර්යයන්.	65	100%	64.6	99%
5	වාත්තු වැඩ ඒකකය මගින් ඉටු කරන කාර්යයන්	30	100%	30.5	100%
6	සැහැල්ලු ඉංජිනේරු වැඩ ඒකකය මගින් ඉටු කරන කාර්යයන්.	20	100%	19.1	95%
7	වාහන අලුත්වැඩියා ඒකකය මඟින් සිදු කරනු ලබන කාර්යයන්.	02	100%	1.5	77%
8	නඩත්තු අංශය	08	100%	10.1	100%
	මුළු එකතුව	**380**		**281.1**	

2023 වර්ෂයේ ජල කළමණාකරනයට අදාල දොරටු නඩත්තු කටයුතු කිහිපයක් සඳහා සම්බන්ධ විණි. එම කාර්යයන් පහත පරිදි වේ.

1. ඉරනමඩු සොරොව් දොරටු වල එසවුම් පද්ධතියේ නඩත්තු කටයුතු
2. කල්මඩු දොරටු වල සේවා සහ නඩත්තු කටයුතු
3. තන්නිමුරප්පු සහ මුතුයන්කට්ටු දොරටුවල Wire Rope මාරු කිරීම
4. පේ ආරු දිය දොරටු වල Wire Rope මාරු කිරීම. (2023 දෙසැම්බර් මස පැවති අයහපත් කාලගුණික තත්ත්වය හමුවේ දින 5ක් වැනි සුළු කාලයකින් නඩත්තු කටයුතු සිදු කර ජලාශයේ ආරක්ෂාව සැලසීම
5. ලුණුගම්වෙහෙර දොරටු වල හදිසි නඩත්තු කටයුතු සිදු කිරීමෙන් සැලසුම් කර තිබූ පරිදි ගොවීන් හට ජලය ලබා දීමට හැකි වීම
6. තොණ්ඩමන් ආරු දිය දොරටු වල හදිසි නඩත්තු කටයුතු සිදු කිරීම



තොන්ඩමනාරු බරාජයේ ජල පාලන දිය දොරටු



ඔලියමුල්ල ගේට්ටුව සෑදීම



රාජාංගනය ජලාශයේ වාන් දොරටු ප්‍රතිසංස්කරණය



දැදුරු ඔය ව්‍යාපෘතියේ ගේට්ටු එසවුම් පද්ධතිය



අලිකොට ආර ව්‍යාපෘතියේ ගේට්ටු එසවුම් පද්ධතිය



කංගානිකුලම් ප්‍රතිසංස්කරණය



නාවක්කුලි බරාජය



නිදහස් දින සැමරුම් වේදිකා



මොරාන



දැදුරු ඔය ව්‍යාපෘති හදිසි ජල පාලන දොරටු



කොම්පෝස්ට් පොහොර කැබලි කිරීමේ යන්ත්‍රය



රාජ්‍ය ලාංඡනය



හපුගල ජල පිරිපහදු ඒකකය



ගල් අමුණ ව්‍යාපෘතියේ ජල පාලන දොරටු



වාත්තු නිෂ්පාදන



කඩදාසි පදම් කරන යන්ත්‍රය (Calendarine Machine)



හුමාල ජනක යන්ත්‍රය



පුළුගුනාවි ව්‍යාපෘතිය සඳහා දිය දොරටු සැකසීම



දැඩි සත්කාර ඒකක ඇඳන්




ග්‍රැබ් බකට් අලුත්වැඩියාව

නව තාක්ෂණය භාවිතය



CNC Milling Machine





CNC Lathe Machine



Laser Cutter



CNC Plasma Cutter



Plano Miller Machine

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

<u>විශේෂ ජයග්‍රහණ</u>

* 2023 වර්ෂය තුලදී ISO 9001:2015 ජාත්‍යන්තර තත්ත්ව පද්ධති සහතිකය 2024 දක්වා යාවත්කාලීන කරන ලදී. ඊට අමතරව CIDA ආයතනයේ ඉදිකිරීම් වෙනුවෙන් EMI (Heavy Steel Fabrication) 2024 දක්වා අලුත් කරන ලදි. EMF (Elevators, Escalators & Revelators) 2024 දක්වා අලුත් කරන ලදි. SP2 Capentry & Joinery) 2024 දක්වා අලුත් කරන ලදි. TVEC යටතේ වැද්දුම් ශිල්පය හා වාත්තු තාක්ෂණ පාඨමාලා සඳහා ලියාපදිංචි වීම.
* පුද්ගලික ආයතන සමඟ තරඟකර ජල පාලන දොරටු අවම මිළ ගනන් යටතේ සාදා සවිකිරීමට හැකිවීම.
* ආනයනික ජල පිරිපහදු ටැංකි වෙනුවට දේශීයව සුදුයකඩ භාවිතා කර අවම පිරිවැයකින් ජල පිරිපහදු ටැංකි නිර්මාණය කර තනා සවිකිරීමට හැකිවීම .
* පාරම්පරික නිශ්පාදන යන්ත්‍ර වෙනුවට නවීන තාක්ෂණය සහිත යන්ත්‍ර සූත්‍ර මිලදීගෙන කාර්යක්ෂම හා උසස් ප්‍රමිතියෙන් යුත් ද්‍රව්‍ය සැකසීමට කටයුතු කිරීම.

<u>අභියෝග</u>

* යාන්ත්‍රික ඉංජිනේරුමය නිෂ්පාදන සහ සේවාවන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සහ උපාංග වෙළඳපොල තුළ බහුලව නොතිබීම නිසා නිෂ්පාදනය කර ලබා ගැනීමට සිදු වීම හා බොහෝ විට විදේශයන් මගින් ආනයනය කර සපයා ගැනීමට සිදු වීම. එබැවින් උපාංග සහ අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ප්‍රමාදයන් සිදු වීම හා සමහර උපාංග ප්‍රායෝගිකව සැලසුම් කර ඇණවුම් කිරීමට නොහැකි වීම නිසාත් සිදු වන ප්‍රමාදයන් (සමහර අවස්ථාවලදී සාම්පල් ඉදිරිපත් කිරීමට සිදු වේ.)
* තාක්ෂණික හා කාර්යාලීය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු දිගින් දිගටම පැවතීම හා කලට වේලාවට පිරවීමේ යන්ත්‍රණයක් නොතිබීම.
* යාන්ත්‍රික ඉංජිනේරු ඉදිකිරීම් සේවා සහ නිෂ්පාදන සඳහා වෙළඳපොල ප්‍රමිතියක් නොමැති වීම හා මේ පිළිබඳව සොයා බැලීමට නියාමන ආයතන නොමැති වීම.
* සම්පූර්ණ කරන ලද කාර්යයන් සඳහා රාජ්‍ය ආයතනවලින් ලැබීමට නියමිත මුදල් නියමිත කාලවකවානු තුළ නොලැබීම.
* රාජ්‍ය ප්‍රතිපත්ති මත ප්‍රසම්පාදන ක්‍රියාවලින්ට අනුගතව කටයුතු සිදුකිරීමට සිදුවීම මත පුද්ගලික ආයතන සමඟ කටයුතු සිදුකිරීමට නොහැකිවීම.
* ආනයනික අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ දී පනවා ඇති නීති මත කාර්යයන් ප්‍රමාද වීම.
* කාර්යසාධන බැඳුම්කර, ලංසු බැඳුම්කර හා වෙනත් බැඳුම්කර ඉදිරිපත් කිරීමට නොහැකි වීම.
* CSR සැපයිම සිදු කිරීමට නොහැකි වීම මත CIDA ආයතනයේ ලියාපදිංචි වීමේදී අභිමත ගැටලු.
* 1993 වර්ෂයේ සිට PL කාණ්ඩයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනිම් සිදු කිරීමට අවස්ථාව සැලසී නොමැති බැවින් PL කාණ්ඩයේ පුරප්පාඩු පිරවීම ගැටලු සහගත වී ඇත.

<u>ඉදිරි ඉලක්ක</u>

* දැනට ඇණවුම් ලැබීම ගිලිහී ගොස් ඇති වාරිමාර්ග දෙපාර්තමේන්තු ඇණවුම්, රෝහල් ගෘහ භාණ්ඩ ඇණවුම්, පොලිස්, තැපැල් දෙපාර්තමේන්තු ඇණවුම් නැවත ලබා ගැනීමට සාකච්ඡා කිරීම.
* මහාමාර්ග සම්බන්ධ ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන මෙවලම් විදේශයන්ගෙන් ගෙන්වීමෙන් තොරව දේශීයව නිෂ්පාදනය කර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
* සාමාන්‍ය මහජනතාව සඳහා අවශ්‍ය යාන්ත්‍රික හා දැවමය කාර්යන්වල නිෂ්පාදන හා සේවා ලබා දීමේ ක්‍රමවේදයක් ඇති කිරීම.
* රටේ වර්ථමාන අවශ්‍යතාවයට අනුව පුහුණු ආයතනයක් ස්ථාපිත කිරීම.
* නිශ්පාදන ධාරිතාව වැඩි කර ගැනීම සඳහා පුද්ගලික අංශ සම්බන්ධ කර ගැනීමට කටයුතු කිරීම.

පරිච්ඡේදය 03 - වසරේ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය **රු.000**

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය **රු.000**

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය **රු.000**

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2023/12/31 දිනට අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

ඒපීපී-ඒන්

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු.		සටහන	2023	2022	
				නතර	
-					
-	මූළු ආදායම් ලැබීම් (අ)	1	0	0	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	0	0	එසිජ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	0	0	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	0	0	
-	මූළු ආදායම් ලැබීම් (අ)		0	0	
-	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		238,390,000	214,046,000	එසිජ-3
-	නැන්පතු		44,817,959	41,672,150	එසිජ-4
-	අත්තිකාරම් ගිණුම්		643,411,167	740,447,137	එසිජ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		0	0	
-	මූළු ආදායම් නොවන ලැබීම් (ආ)		926,619,126	996,165,288	
-	මූළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		926,619,126	996,165,288	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		16,895,180	16,895,043	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ= (ඇ)-(ඇ)		909,723,946	979,270,244	
	අඩුකළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
170,800,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	88,317,269	98,401,331	
48,100,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	42,242,728	23,190,801	එසිජ-2(ii)
1,800,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	0	715,616	
-	පොළී ගෙවීම්	8	1,168,218	0	
70,800,000.00	වෙනත් පුනරාවර්තන වියදම්	9	70,758,133.57	21,402,480	
291,500,000	මූළු පුනරාවර්තන වියදම් (ඊ)		202,486,349	143,710,227	
	මූලධන වියදම්				
42,600,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	20,898,057	23,436,523	
5,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,998,225	7,335,911	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	0	0	එසිජ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	0	0	
1,800,000	හැකියා වර්ධනය	14	1,691,793	300,000	
1,000,000	වෙනත් මූලධන වියදම්	15	1,000,000.00	500,000.00	
50,400,000	මූළු මූලධන වියදම් (උ)		25,588,075	31,572,434	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)				
	නැන්පතු ගෙවීම්		45,598,953	72,541,851	එසිජ-4
	අත්තිකාරම් ගෙවීම්		588,750,173	753,443,765	එසිජ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		0	0	
	මූළු ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		634,349,127	825,985,616	
	මූළු වියදම් එ = (ඊ+උ+ඌ)		862,423,550	1,001,268,277	
	2023 දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		47,300,395	(21,998,033)	
	අග්‍රිම සැපදුම් ප්‍රකාශය ආරම්භක ශේෂය		47,300,395	(21,998,033)	එසිජ 7
	2023 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		0	0	එසිජ 3

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2023.12.31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

	සටහන	2023	2022
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,009,227,853	1,007,229,627
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	(209,609,812)	(154,948,819)
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	0	0
මුළු වත්කම්		799,618,041	852,280,808
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(232,647,098)	(178,767,099)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,009,227,853	1,007,229,627
කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම	ඒසිඒ- 5/5(බී)	0	0
ජංගම වගකීම්			
කැන්පතු ගිණුම්	ඒසිඒ-4	23,037,286	23,818,280
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	0	0
මුළු වගකීම්		799,618,041	852,280,808

පිටු අංක 06 සිට 38 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 39 සිට 47 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම : ඩබ්. එස්. සත්‍යානන්ද	නම : ඒ. විජේසිංහ	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර : ලේකම්	තනතුර : අධ්‍යක්ෂ ජනරාල්	නම : ඩබ්. එච්. සී. හිමාලි
දිනය : 2024/02/27	දිනය : 2024/02/26	දිනය : 2024/02/26
ඩබ්ලිව්.එස්. සත්‍යානන්ද	ඉංජි. ඒ. විජේසිංහ	ඩබ්ලිව්.එච්.සී. හිමාලි
SLAS (SPECIAL GRADE)	අධ්‍යක්ෂ ජනරාල්	ප්‍රධාන ගණකාධිකාරි
MBA(Ballarat), PGD(La-Trobe),BSc (Sri Jayawardenepura)	රජයේ කර්මාන්ත සහ ඉඳුරාජ්‍ය ඉංජිනේරු	ශ්‍රී ලං.ග.සේ. - 1
ලේකම්	සේවයේ සංවර්ධන හා පුහුණු ආයතනය	රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
ජාතික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	කොළොන්නාව	කොළොන්නාව
12 වන මහල, "සෙත්සිරිපාය" II වන අදියර, බත්තරමුල්ල.		

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ජේ.සී.ජී-සී
2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල බඳු ලැබීම්		
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		
ලාභ		
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	16,883,010	68,849,133
අග්‍රිම ලැබීම්	238,390,000	214,046,000
අත්තිකාරම් අයකර ගැනීම්	645,297,160	740,871,944
නැන්පතු ලැබීම්	44,817,959	41,672,150
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	945,388,128	1,065,439,227
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	200,206,380	142,264,557
සහනාධාර සහ මාරුකිරීම්	1,168,218	715,616
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	67,181,148	48,356,527
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	16,895,180	16,895,043
අත්තිකාරම් ගෙවීම්	588,750,173	753,093,199
නැන්පතු ගෙවීම්	45,598,953	72,541,851
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	919,800,053	1,033,866,793
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	25,588,075	31,572,434
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	0	0
ලාභාංශ	0	0
හිමිකම ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	0	0
උපණය අයකර ගැනීම්	0	0
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	0	0
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	25,588,075	31,572,434
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	25,588,075	31,572,434
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(25,588,075)	(31,572,434)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	0	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	0	0
විදේශීය ණය ගැනීම්	0	0
ප්‍රදානයන් ලැබීම්	0	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	0	0
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	0	0
විදේශීය ණය ආපසු ගෙවීම්	0	0
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	0	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	0	0
		0
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	0	0
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	0	0
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	0	0

4

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය
(මූ.රෙ. 106 හා මූ.රෙ. 113 යටතේ වන පාඩු)

ඇමුණුම -(i)

රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 310

වැඩසටහන් අංකය හා නාමය : 02, සංවර්ධන වැඩසටහන්

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අගය			සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු		නැත
රු	25,000.01	වැඩි		
	එකතුව			-

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
එකතුව		0

(ii) නවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

අහය			සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු	1	20,050.00
රු	25,000.01	වැඩි		663,890.00
	එකතුව			683,940.00

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
එකතුව		

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	6
	ගණන - රු	683,940.00
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	
	ගණන - රු	
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	
	ගණන - රු	

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මූ.රෙ. 106 යටතේ වන හානි හා මූ.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

ප්‍රධාන මූලය නිලධාරී/ මූල්‍ය ප්‍රතිපාදනාධිකාරී
අධ්‍යක්ෂ (මූල්‍ය)/ කොමසාරිස් (මූල්‍ය)
දිනය : 2024/01/31

ඩබ්ලිව්.එච්.සී. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරී
මූ මෙ.සේ. - 1
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
කොළොන්නාව

ඇමුණුම-(ii)

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 310 රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය: 02, සංවර්ධන වැඩසටහන්

1 වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අභය		සිද්ධි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i)	රු. 25,000.00 අඩු	.....	නැත
(ii)	රු. 25,000.00 වැඩි	.....	නැත
	එකතුව		

2 වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය

අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය රු.	අලාභයේ වටිනාකම රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හල අගය රු.	කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම් සඳහා වූ අනුමැතියේ යොමු අංකය
නැත						
එකතුව						

සටහන - ඒසිඒ 4(i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /සහකාරිසාරිස් (මුදල්)
දිනය : 2024.07.26

ඩබ්ලිව්.ඒච්.සී. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරී
ශ්‍රී ලං.ග.සේ. - 1
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
කොළොන්නාව

බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 310

වැඩසටහන් අංකය හා නාමය:02, සංවර්ධන වැඩසටහන්

PVT	Lanka Electricity Company (Private) Limited	P2312C17	12/29/2023	310-2-1-0-1403-P	77,946	0	12/29/2023 12:06	77,946	-	-	77,946 BOC
PVT	Lanka Electricity Company (Private) Limited	P2312C18	12/29/2023	310-2-1-0-1403-P	3,803	0	12/29/2023 12:06	3,803	-	-	3,803 BOC
PVT	Lanka Electricity Company (Private) Limited	P2312C19	12/29/2023	310-2-1-0-1403-P	7,424	0	12/29/2023 12:06	7,424	-	-	7,424 BOC
PVT	Lanka Electricity Company (Private) Limited	P2312C20	12/29/2023	310-2-1-0-1403-P	3,547	0	12/29/2023 12:06	3,547	-	-	3,547 BOC
PVT	Lanka Electricity Company (Private) Limited	P2312C21	12/29/2023	310-2-1-0-1403-P	3,801	0	12/29/2023 12:06	3,801	-	-	3,801 BOC
PVT	Lanka Electricity Company (Private) Limited	P2312C22	12/29/2023	310-2-1-0-1403-P	7,485	0	12/29/2023 12:06	7,485	-	-	7,485 BOC
PVT	Kolonnawa Urban Council	P2312C23	12/29/2023	310-2-1-0-1409-P	78,160	0	12/29/2023 12:06	78,160	-	-	78,160 BOC
PVT	Never Back Security (Pvt) Ltd	P2312C24	12/29/2023	310-2-1-0-1409-P	1,005,965	0	12/29/2023 12:06	1,005,965	-	-	1,005,965 BOC
PVT	The Associated Newspapers Of Ceylon Ltd	P2312C25	12/29/2023	310-2-1-0-1409-P	47,541	0	12/29/2023 12:06	47,541	-	-	47,541 BOC
PVT	Central Implex (Pvt) Ltd	P2312C26	12/29/2023	310-2-1-0-2002-P	11,750	0	12/29/2023 12:06	11,750	-	-	11,750 BOC
PVT	Metropolitan Technologies (Pvt) Ltd	P2312C27	12/29/2023	310-2-1-0-2002-P	23,115	0	12/29/2023 12:06	23,115	-	-	23,115 BOC
PVT	Pettah Computers	P2312C28	12/29/2023	310-2-1-0-2002-P	4,250	0	12/29/2023 12:06	4,250	-	-	4,250 BOC
PVT	Toyota Lanka (Private) Limited	P2312C29	12/29/2023	310-2-1-0-2003-P	74,415	0	12/29/2023 12:06	74,415	-	-	74,415 BOC
PVT	Pettah Computers	P2312C30	12/29/2023	310-2-1-0-2103-P	7,500	0	12/29/2023 12:06	7,500	-	-	7,500 BOC
PVT	CMN Distributors Lanka Pvt Ltd	P2312C31	12/29/2023	310-2-1-0-2103-P	999,350	0	12/29/2023 12:06	999,350	-	-	999,350 BOC
PVT	CMN Distributors Lanka Pvt Ltd	P2312C32	12/29/2023	310-2-1-0-2103-P	285,200	0	12/29/2023 12:06	285,200	-	-	285,200 BOC
PVT	CMN Distributors Lanka Pvt Ltd	P2312C33	12/29/2023	310-2-1-0-2103-P	27,025	0	12/29/2023 12:06	27,025	-	-	27,025 BOC
PVT	Pilot Stationers (Pvt) Ltd	P2312C34	12/29/2023	310-2-1-0-1201-P	19,665	0	12/29/2023 12:06	19,665	-	-	19,665 BOC
PVT	Pilot Stationers (Pvt) Ltd	P2312C35	12/29/2023	310-2-1-0-1201-P	8,338	0	12/29/2023 12:06	8,338	-	-	8,338 BOC
PVT	A.Wijesinghe	P2312C36	12/29/2023	310-2-1-0-2401-P	7,086	0	12/29/2023 12:06	7,086	-	-	7,086 BOC
PVT	Neat Lanka (Pvt) Ltd	P2312C07	12/29/2023	310-2-1-0-1201-P	91,500	0	12/29/2023 12:06	91,500	-	-	91,500 BOC
PVT	CameraLK (PVT) LTD	P2312C08	12/29/2023	310-2-1-0-1201-P	43,500	0	12/29/2023 12:06	43,500	-	-	43,500 BOC
PVT	Pilot Stationers (Pvt) Ltd	P2312C09	12/29/2023	310-2-1-0-1201-P	1,495	0	12/29/2023 12:06	1,495	-	-	1,495 BOC
PVT	Colt Trading Company (Pvt) Ltd	P2312C10	12/29/2023	310-2-1-0-1201-P	22,540	0	12/29/2023 12:06	22,540	-	-	22,540 BOC
PVT	Mercurei Stationers	P2312C11	12/29/2023	310-2-1-0-1201-P	5,450	0	12/29/2023 12:06	5,450	-	-	5,450 BOC
PVT	Mercurei Stationers	P2312C12	12/29/2023	310-2-1-0-1201-P	56,000	0	12/29/2023 12:06	56,000	-	-	56,000 BOC
PVT	Pettah Computers	P2312C13	12/29/2023	310-2-1-0-1302-P	3,500	0	12/29/2023 12:06	3,500	-	-	3,500 BOC
PVT	Sri Lanka State Trading (Gen) Corporation Ltd	P2312C14	12/29/2023	310-2-1-0-1302-P	2,900	0	12/29/2023 12:06	2,900	-	-	2,900 BOC
PVT	J.D.Nimalarathna	P2312C15	12/29/2023	310-2-1-0-1402-P	4,200	0	12/29/2023 12:06	4,200	-	-	4,200 BOC
PVT	Nimal Rathnaweera	P2312C38	12/29/2023	310-2-1-0-2401-P	45,000	0	12/29/2023 12:06	45,000	-	-	45,000 BOC
PVT	Pettah Computers	P2312C39	12/29/2023	310-2-1-0-2002-P	4,250	0	12/29/2023 12:06	4,250	-	-	4,250 BOC
PVT	Fakhri Trading Company	P2312C40	12/29/2023	310-2-1-0-1201-P	13,590	0	12/29/2023 12:06	13,590	-	-	13,590 BOC
PVT	Fakhri Trading Company	P2312C41	12/29/2023	310-2-1-0-1201-P	66,530	0	12/29/2023 12:06	66,530	-	-	66,530 BOC
PVT	Jetform Technologies	P2312C42	12/29/2023	310-2-1-0-1201-P	27,000	0	12/29/2023 12:06	27,000	-	-	27,000 BOC
PVT	Champion Trades Centre	P2312C43	12/29/2023	310-2-1-0-2001-P	3,942	0	12/29/2023 12:06	3,942	-	-	3,942 BOC
PVT	Kalhari Builders (PVT) Ltd	P2312C44	12/29/2023	310-2-1-0-2001-P	40,650	0	12/29/2023 12:06	40,650	-	-	40,650 BOC
PVT	Universal Tyres Private Limited	P2312C45	12/29/2023	310-2-1-0-2003-P	35,190	0	12/29/2023 12:06	35,190	-	-	35,190 BOC
PVT	Lankan AN Global Merchant Solutions (Pvt) Ltd	P2312C46	12/29/2023	310-2-1-0-2002-P	4,400	0	12/29/2023 12:06	4,400	-	-	4,400 BOC

PVT	Lankan AN Global Merchant Solutions (Pvt) Ltd	P2312C46	12/29/2023	310-2-1-0-2002-P	4,400	0	12/29/2023 12:06	4,400	-	-	4,400	BOC
PVT	Simplex Corporation (Pvt) Ltd	P2312C48	12/29/2023	310-2-1-0-1402-P	113,850	0	12/29/2023 12:18	113,850	-	-	113,850	BOC
PVT	Shop 21 - OT	P2312C49	12/29/2023	310-2-1-0-1002-P	13,297	0	12/29/2023 13:49	13,297	-	-	13,297	BOC
PVT	Shop 21 - OT	P2312C50	12/29/2023	310-2-1-0-1002-P	6,748	0	12/29/2023 13:49	6,748	-	-	6,748	BOC
PVT	Shop 21 - OT/Bata	P2312C51	12/29/2023	310-2-1-0-1101-P	3,560	0	12/29/2023 13:49	3,560	-	-	3,560	BOC
PVT	Shop 22 - OT/Bata	P2312C52	12/29/2023	310-2-1-0-1002-P	63,583	0	12/29/2023 13:49	63,583	-	-	63,583	BOC
PVT	Shop 22 - OT/Bata	P2312C53	12/29/2023	310-2-1-0-1101-P	33,600	0	12/29/2023 13:49	33,600	-	-	33,600	BOC
PVT	H.A.V.K.Hettiarachchi	P2312C54	12/29/2023	310-2-1-0-1101-P	6,124	0	12/29/2023 13:49	6,124	-	-	6,124	BOC
PVT	W.M.N.S.B.Narampanawa	P2312C55	12/29/2023	310-2-1-0-1101-P	8,000	0	12/29/2023 13:49	8,000	-	-	8,000	BOC
PVT	Training Allowance	P2312C56	12/29/2023	310-2-1-0-1003-P	94,500	0	12/29/2023 13:49	94,500	-	-	94,500	BOC
PVT	Shop 15 - Bata	P2312C57	12/29/2023	310-2-1-0-1101-P	72,106	0	12/29/2023 12:21	72,106	-	-	72,106	BOC
PVT	Shop 15 - Night	P2312C57*1	12/29/2023	310-2-1-0-1101-P	12,800	0	12/29/2023 12:21	12,800	-	-	12,800	BOC
PVT	Shop 22 - Night	P2312C58	12/29/2023	310-2-1-0-1002-P	11,363	0	12/29/2023 12:21	11,363	-	-	11,363	BOC
PVT	R.P.Y.M.Rajapakshe	P2312C59	12/29/2023	310-2-1-0-2401-P	4,565	0	12/29/2023 10:36	4,565	-	-	4,565	BOC
PVT	Shop 21 - OT	P2312C60	12/29/2023	310-2-1-0-1002-P	5,638	0	12/29/2023 13:34	5,638	-	-	5,638	BOC
PVT	R.P.Y.M.Rajapakshe	P2312C61	12/29/2023	310-2-1-0-1002-P	3,456	0	12/29/2023 14:36	3,456	-	-	3,456	BOC
PVT	Fakhri Trading Company	P2312C01	12/29/2023	310-2-1-0-1201-P	3,100	0	12/29/2023 12:06	3,100	-	-	3,100	BOC
PVT	Fakhri Trading Company	P2312C02	12/29/2023	310-2-1-0-1201-P	675	0	12/29/2023 12:06	675	-	-	675	BOC
PVT	Lankan An Global Merchant Solutions (Pvt) Ltd	P2312C03	12/29/2023	310-2-1-0-1201-P	4,900	0	12/29/2023 12:06	4,900	-	-	4,900	BOC
PVT	Lakwin Enterprises	P2312C04	12/29/2023	310-2-1-0-1201-P	5,403	0	12/29/2023 12:06	5,403	-	-	5,403	BOC
PVT	Shop 15 - Bata/N	P2312C65	12/29/2023	310-2-1-0-1101-P	18,920	0	12/29/2023 14:41	18,920	-	-	18,920	BOC
PVT	Shop 15 - Bata/N	P2312C66	12/29/2023	310-2-1-0-1101-P	32,550	0	12/29/2023 14:41	32,550	-	-	32,550	BOC
PVT	K.M.G.Rukshan Prabodha	P2312C67	12/29/2023	310-2-1-0-1101-P	5,600	0	12/29/2023 13:07	5,600	-	-	5,600	BOC
PVT	Lanka Electricity Company (Private) Limited	P2312C68	12/29/2023	310-2-1-0-1402-P	93,140	0	12/29/2023 12:28	93,140	-	-	93,140	BOC
PVT	Sri Lanka Telecom PLC	P2312C69	12/29/2023	310-2-1-0-1402-P	39,968	0	12/29/2023 12:28	39,968	-	-	39,968	BOC
PVT	H.A.Samantha	P2312C70	12/29/2023	310-2-1-0-1002-P	5,607	0	12/29/2023 12:34	5,607	-	-	5,607	BOC
PVT	Topshine Environmental Services (Pvt) Ltd	P2312C63	12/29/2023	310-2-1-0-1409-P	319,631	0	12/29/2023 10:06	319,631	-	-	319,631	BOC
PVT	Uni-Tec Lanka Engineering Co.(Pvt) Ltd	P2312C74	12/29/2023	310-2-1-0-2002-P	4,965,056	0	12/29/2023 12:31	4,965,056	-	-	4,965,056	BOC
PVT	New Ashford International (Pvt) Ltd	P2312C75	12/29/2023	310-2-1-0-2003-P	74,131	0	12/29/2023 12:33	74,131	-	-	74,131	BOC
SOE	National Water Supply And Drainage Board	P2312C64	12/29/2023	310-2-1-0-1402-P	261,472	0	12/29/2023 14:41	261,472	-	-	261,472	BOC
SOE	National Water Supply And Drainage Board	P2312C71-7	12/29/2023	310-2-1-0-1403-P	26,691	0	12/29/2023 12:28	26,691	-	-	26,691	BOC
SOE	State Printing Corporation	P2312C05	12/29/2023	310-2-1-0-1201-P	39,828	0	12/29/2023 12:06	39,828	-	-	39,828	BOC
SOE	State Printing Corporation	P2312C06	12/29/2023	310-2-1-0-1201-P	18,308	0	12/29/2023 12:06	18,308	-	-	18,308	BOC
SOE	National Apprentice and Industrial Training Authority	P2312C62	12/29/2023	310-2-1-0-1409-P	56,000	0	12/29/2023 14:44	56,000	-	-	56,000	BOC
SOE	National Water Supply And Drainage Board	P2312C47	12/29/2023	310-2-1-0-1402-P	230,176	0	12/29/2023 12:18	230,176	-	-	230,176	BOC
SOE	National Water Supply And Drainage Board	P2312C16	12/29/2023	310-2-1-0-1403-P	30,659	0	12/29/2023 12:06	30,659	-	-	30,659	BOC
SOE	Industrial Development Board	P2312C37	12/29/2023	310-2-1-0-2401-P	6,000	0	12/29/2023 12:06	6,000	-	-	6,000	BOC

CIGAS Generated report.

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය

රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 310

වැඩසටහන් අංකය හා නාමය: 02, සංවර්ධන වැඩසටහන්

බැඳීම් ලාභියාගේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	වටිනාකම (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු						
නැත						
නැත						
එකතුව						
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල						
නැත	←	නැත	→	←		
එකතුව						
3. වෙනත් (පෞද්ගලික අංශය)						
නැත						
නැත						
එකතුව						
මුළු එකතුව						

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /ලේකාම්සාරිස් (මුදල්)
දිනය : 2024.02.26

ඩබ්ලිව්.එච්.සී. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරී
ශ්‍රී ලං.ශ.සේ. 1
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
කොළඹ 07

ඇමුණුම-(v)

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (ii)

මු.රෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 310
වැඩසටහන් අංකය හා නාමය: 02, සංවර්ධන වැඩසටහන්

ණයහිමියාගේ/ගෙවීම් ලාභියාගේ නම* (ප්‍රතිපාදන මාරු කරන විට හඳුනාගෙන නිබිය යුතුය)	වගකීම් පිළිබඳ විස්තරය	ණයවර ලිපි අංක ආදිය	ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීර්ෂයකින්ද				මාරුකරන ලද මුදල රු.
			ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු එකතුව							
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල එකතුව			----------	නැත	----------		
3. වෙනත් (පෞද්ගලික අංශය) එකතුව							

.....
~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමිසාරිස් (මුදල්)
දිනය : 2024/3/26

ඩබ්ලිව්.එච්.සී. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරී
ශ්‍රී ලං.ගා.සේ. - 1
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
කොළඹ 07.

ඇමුණුම -(vi)

ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 02, සංවර්ධන වැඩසටහන්

රු.

(1)	ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ, පරිපූරක වෙන්කිරීම්ද ඇතුළුව 2023 ඇස්තමේන්තුගත වෙන්කිරීම්	
(2)	ඉහත (1) ට අදාළ 2023 වර්ෂය තුළදී දරන ලද මුළු වියදම්	
(3)	2023 ජනවාරි 01 දිනට ලැබීමට නියමිත නිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව	
(4)	2022 හා ඊට පෙර වර්ෂවලට අදාළව, 2023 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව (ඇන්නම්)	
(5)	2023 වර්ෂය සම්බන්ධයෙන් 2023 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව	
(6)	2022 හා ඊට පෙර වර්ෂ වෙතුවෙන් වූ හිමිකම්පැම් සම්බන්ධයෙන් 2023 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමිවල එකතුව	
(7)	2023 වර්ෂය සම්බන්ධයෙන් 2023 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමිවල එකතුව	
(8)	2022 හා ඊට පෙර වර්ෂ වෙතුවෙන් 2023 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව	
(9)	2023 වර්ෂය වෙතුවෙන් 2023 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව	
(10)	2023 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව නිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව {[(3+4+5) - (6+7) - }8+9)]	නැත
(11)	විසර්ජන ගිණුම් පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2023 වර්ෂය සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව	
(12)	විසර්ජන ගිණුම් පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2023 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව	
(13)	විසර්ජන ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව (10 + 11 - 12)	

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමිසාරිස් (මුදල්)
දිනය : 2024/03/28

ඩබ්ලිව්.එච්.සී. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරී
ශ්‍රී ලං.ශ.සේ. - 1
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

ඇමුණුම-(vii)

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය

රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 310

වැඩසටහන් අංකය හා නාමය: 02, සංවර්ධන වැඩසටහන්

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
		← නැත →		

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමිසාරිස් (මුදල්)
දිනය : 2024/02/24

ඩබ්ලිව්.එච්.සී. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරී
ශ්‍රී ලං.ශ.සේ. - 1
[illegible]

ඇමුණුම-(viii)

2007/09/05 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් වක්‍රලේඛ අංක 2007/05 හි (1) වැනි ඡේදයේ උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද නව බැංකු ගිණුම් පිළිබඳ 2023.12.31 දිනට තත්ත්ව වාර්තාව

විෂයභාර ගිණුම් අංකය: 310 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2023/12/31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2023.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2023.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇනොත්) රු.	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
1	ලංකා බැංකුව	7042705	16,894,743.97	-	-	2023 දෙසැම්බර්
2	ලංකා බැංකුව	7042706	4,010,716.66	-	-	2023 දෙසැම්බර්
3	ලංකා බැංකුව	7042729	22,472,927.51		7,401.58	2024 දෙසැම්බර්

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

.....

ප්‍රධාන ගිලා තිලකාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024/02/26

ඩබ්ලිව්.එච්.සි. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරී
ශ්‍රී ලං.ශ.සේ. - 1
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
කොළොන්නාව

3.5 ආදායම් එකතු කිරීම් සාධනය රු.000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුව ප්‍රතිශතයක්ලෙස
2002.01.01	රජයේ ගොඩනැගිලි කුලී			5,717	
2002.02.99	පොලිය හා අනෙකුත්	900	900	910	101%
2003.99.00	විකුණුම් හා ගාස්තු අනෙකුත් ලැබීම්	-	-	1,522	

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය රු.000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ප්‍රතිපාදන අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණය % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
පුනරාවර්තන	291,500	291,500	202,486	69%
ප්‍රාග්ධන	50,400	50,400	25,588	51%

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2023	31.12.2023 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	ස්ථාවර වත්කම් සමීක්ෂණය යටතේ ඉහත අයිතම වල සමීක්ෂණ කටයුතු සිදු කිරීමට ප්‍රතිපාදන නොමැති නිසා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂයන් ලබා දිය නොහැක.	408,971
9152	යන්ත්‍රෝපකරණ		286,786
	වාහන		73,471
9153	ඉඩම්		240,000
9160	WIP		-

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාංගණනය කළ මතය

ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වෙතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ඉඩ ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට සහ

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණු බවට

ඉකුත් වර්ෂයට අදාල වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1(ආ) (ii)	2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව 2008 හා 2009 වර්ෂවල පැවති ණයගැනි ශේෂවල එකතුව රු.36,941,553 ක් වූවද ලියා හැරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිත කමිටු වාර්තාව ප්‍රකාරව එම ණයගැතියන්ගේ එකතුව රු. 4,045,992 ක් විය. එසේ නිබියදී මූල්‍ය ප්‍රකාශයන්හි 2008 හා 2009 වර්ෂයට අදාළ ඉහත සඳහන් රු.36,941,553 ක් වූ මුළු ශේෂයම කපාහැර තිබුණි.	1.6.4 (ක)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

වත්කම් හඳුනා ගැනීමේ කේතාංක ඇතුලත් කර නොතිබීම හේතුවෙන් සිගාස් මගින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් වාර්තාවෙහි භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන්හි පවත්නා වත්කම් පමණක්ම ඇතුළත්ද, වත්කම් අපහරනයන්හිදී කුමන වත්කම් ඉවත් කර තිබේද, කුමන වත්කම් දෙපාර්තමේන්තුව තුල පවතින්නේද යන්න හඳුනා ගැනීමට විගණනයට නොහැකි විය. එමෙන්ම මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන රු.1,009,227,853 ක් වටිනා වත්කම් සත්‍ය වශයෙන්ම දෙපාර්තමේන්තුව තුල භෞතිකව පවත්නා වත්කම් පමණක් බව තහවුරු නොවීය.

1.6.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී"ගිණුමෙහි 2023 ජනවාරි 01 දිනට නිලධාරියකුගෙන් අයවිය යුතුව තිබූ රු.116,880ක ශේෂය සාමාජික ණය ලේඛණයෙහි ඇතුළත් කර නොතිබුණි.

(ආ) කොළඹ මහා නගර සභාවට 2016 වසරේදී මාරු වී ගිය නිලධාරියකුගේ නිරවුල් නොකළ 2023 ජනවාරි 01 දිනට රු.133,554 ක්ව පැවති ශේෂයෙන් වර්ෂය තුලදී මාස 4 ක් සඳහා රු.4,744 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ඇ) විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.420,905 ක වර්ෂ 10 ට වැඩි ණය ශේෂය සඳහා කිසිදු මුදලක් මෙතෙක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) වැඩ තහනම් කර ඇති නිලධාරියකුගෙන් අය විය යුතුව පවතින වර්ෂ 10 ත් 20ත් අතර පැරණි රු.142,650ක ණය ශේෂය මෙතෙක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 13 දෙනෙකුගේ වර්ෂ 20 ට වැඩි රු.59,800 ක ශේෂය, වර්ෂ10 ත් 20ත් අතර වූ රු.282,880 ක ශේෂය, වර්ෂ 05 ත් 10ත් අතර අයවිය යුතුව පවතින රු.227,550 ක ශේෂය හා රු.82,360 ක වර්ෂ 01ත් 03ත් අතර වන වෙනත් ණය ශේෂයන් මෙතෙක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

1.6.3 ගබඩා අත්තිකාරම් ගිණුම

(අ) මු.රෙ 501 ප්‍රකාරව ගබඩා අත්තිකාරම් ගිණුම් පවත්වාගනු ලබන්නේ ලාභදායන අදහසින් හෝ පාඩු අපේක්ෂාවෙන් නොවන අතර, භාණ්ඩ ගෙන එනු ලබන මිළට භාණ්ඩ තොගය ගණන් ගනු ලබයි. එසේ වුවද භාණ්ඩ මිළදී ගැනීමට, ගබඩා කිරීමට හා මෙහෙයුම් කටයුතු සඳහා වන වියදම් ආවරණය වන පරිදි පිරිවැයට සියයට 10 ක් මුල් මාස 06 සඳහා ද ,සියයට 8 ක් අග මාස 06 සඳහාද එකතුකර තොග නිකුත් කරනු ලබන බව 2023 ගබඩා අත්තිකාරම් ගිණුමේ පෙරවදනෙහි දක්වා තිබුණි.මේ හේතුවෙන් නිකුත් කිරීම් පිරිවැය හා අනෙකුත් සේවක හා සැපයුම් වියදම් අඩුකල පසු රු.5,437,455ක අතිරික්තයක් (දළ වියදම් ඉක්මවූ නිකුත් කිරීම්) ගිණුමෙහි පෙන්නුම් කරයි.

(ආ) තවද සමාලෝචිත වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමෙන් කළ වැඩ අත්තිකාරම් ගිණුමට නිකුත් කල ද්‍රව්‍යවල පිරිවැය රු.111,541,429 ක් වූ අතර මෙම නිකුත්කිරීම්වල ගණනය කරන ලද වටිනාකම රු.127,685,080 ක් වී තිබුණි. මේ අනුව ගබඩා කිරීම් හා මෙහෙයුම් කටයුතු සඳහා වන වියදම්

ආවරණය සඳහා රු.16,143,651 ක අගයක් එකතුකර තිබුණි. ඒ අනුව එම අගය නිකුත් කිරීම්වල පිරිවැයෙන් සියයට 14.5 ක ප්‍රමාණයක් දක්වා වැඩි වී තිබුණු බවද නිරීක්ෂණය විය.

1.6.4 කල වැඩ අත්තිකාරම් ගිණුම

(අ) සමාලෝචිත වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමෙහි අතිරික්තය වූ රු.5,437,456 ක් කළ වැඩ අත්තිකාරම් ගිණුමට අනුචිත ලෙස ගලපා තිබුණි. මේ හේතුවෙන් නිෂ්පාදන පිරිවැය රු.5,437,456 කින් අඩුවෙන් දක්වා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. එබැවින් 2023 වර්ෂයේදී කලවැඩ අත්තිකාරම් ගිණුමෙහි දක්වා ඇති රු.5,377,653 ක් වූ අලාභය එම ගැලපුම සිදුකර නොතිබුණි නම් රු.10,815,109 ක අලාභයක් දක්වා වැඩි වීමට හේතුවේ. මීට අමතරව ගබඩා අත්තිකාරම් ගිණුමට අදාල සේවක අතිකාල, බටා හා ප්‍රවාහන වියදම් එකතුව රු.10,706,195 ක්ද නිෂ්පාදන පිරිවැය ගණනයේදී අඩුකර තිබුණි. මේ තත්ත්වයද සලකා බැලීමේදී අලාභය එම අගයෙන් ද වැඩි වනු ඇති බවද නිරීක්ෂණය වේ. ඒ අනුව කළ වැඩ අත්තිකාරම් ගිණුමේ මුළු අලාභය රු. 21,521,304ක් වන බව නිරීක්ෂණය විය.

(ආ) 2023 වර්ෂයේ විකුණුම් ලෙස රු.243,243,793 ක් මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රකාශයේ ආදායම් හඳුනා ගැනීම සම්බන්ධයෙන් දක්වා ඇති ප්‍රතිපත්තියට පටහැනිව විකුණුම් ඉන්වොයිස් ලැයිස්තුවේ කලවැඩ ඉන්වොයිස් අගය ලෙස දක්වා තිබුණේ සත්‍ය වියදම නොව ඊට වඩා වැඩි අගයක් වූ මුළු ඇස්තමේන්තුගත වටිනාකම වේ. තවද 2023 දෙසැම්බර් 31 දිනට නිමකොට නොතිබුණු වැඩ පත්‍රිකා වෙනුවෙන් ඉන්වොයිස් ඉදිරිපත්කර ණයට විකුණුම් ලෙසත් ණයගැතියන් ලෙසත් ගිණුම්ගත කිරීමෙන් විකුණුම් වටිනාකම හා ණයගැතියන් වැඩි අගයකට ගිණුම්ගත කර තිබුණි.

ii. වැඩපත්වල සත්‍ය වියදම වැඩපතෙහි ඇස්තමේන්තුගත අගයට වඩා වැඩි අගයක් ගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර මේ හේතුවෙන් වියදම් දරා තිබුණද එම වියදම ඉන්වොයිස්ගත කර නොතිබීමෙන් සත්‍ය වියදම් වූ මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

iii. සමුච්චිත වැඩ පත්‍රිකා සාරාංශ වාර්තාව අනුව ඇස්තමේන්තුගත අමුද්‍රව්‍ය, හා ශ්‍රමය වෙන් වෙන් වශයෙන් දක්වා නොතිබුණු අතර ඇස්තමේන්තුගත සියළුම අගයන්, අනෙකුත් ඇස්තමේන්තුගත වියදම් යටතේ දක්වා තිබුණි. ඒ අනුව විකුණුම් ඉන්වොයිස්වල ඇතුලත් අගයන්ගේ හා

ඇස්තමේන්තුගත අගයන් අතර විචලනයක් කවර හේතුවක් නිසා ඇති වූයේද යන්න පැහැදිලි නොවීය.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 102 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශන මුහුණතෙහි රේඛිය අයිතම ඇතුලත් කල යුතු වුවද ලී බඩු ක්ෂය සෘජුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුලත් කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 54 ඡේදය ප්‍රකාරව අස්පීත්වයක් විසින් පෙර කාලපරිච්ඡේද වැරදි සම්බන්ධයෙන් වරදෙහි ස්වභාවය, හැකිතාක් දුරට මූල්‍ය ප්‍රකාශන වල රේඛිය අයිතමයන් සඳහා නිවැරදි කල යුතු මුදල, ඉදිරිපත් කර ඇති පැරණිතම පෙර කාලපරිච්ඡේදය ආරම්භයේ නිවැරදි කරන ප්‍රමාණය සහ අතීතානුයෝගී නැවත ප්‍රකාශ කිරීම ප්‍රායෝගික නොවන්නේ නම් එම තත්ත්වය ඇති වීමට තුඩු දුන් හේතු සහ වරද නිවැරදි කර ඇත්තේ කවර කාලයක සිටද යන්න පිලිබඳ විස්තරයක් යනාදිය හෙළිදරව් කළ යුතු වුවත් පෙර වර්ෂ ගැලපීම් ලෙස ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශයෙහි සමුච්චිත ලාභය සඳහා රු. 45,689,802 ක ගැලපීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කොට නොතිබුණි.

(ඉ) දේපළ, පිරියත උපකරණ ගිණුම්ගත කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ට අනුකූලව කටයුතු කල යුතුව තිබුණද ඒ අනුව මූල්‍ය ප්‍රකාශ සටහන් දක්වන ලද බවට සාක්ෂි නොවිය. ඒ අනුව ස්ථාවර වත්කම්වල ආරම්භක ශේෂය, එකතු කිරීම්, ඉවත් කිරීම්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව ක්ෂය, දළ ධාරණ අගය, සමුච්චිත ක්ෂය, ශුද්ධ ධාරණ අගය ආදිය දේපළ පිරියත උපකරණ සටහනෙහි ඇතුලත් විය යුතු වුවද එහි 'මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව අවසන් ශේෂය' ලෙස ශුද්ධ අගය වෙනුවට පිරිවැය සටහන් කොට තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 86 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල එක් එක් දේපළ, පිරියත හා උපකරණ පන්තිය සම්බන්ධයෙන් වර්ෂය ආරම්භයේ හා අවසානයේ සමුච්ඡිත ක්ෂය අගයන් සටහන් මගින් හෙළිදරව් කොට නොතිබුණි.

(උ) කලවැඩ අත්තිකාරම් ගිණුමෙහි ස්ථාවර වත්කම්වලින් ඉවත්කරන ලද රු.17,569,150 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවලද රු. 24,421,497 ක් වටිනා ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණවලද කේතාංක විගණනය වෙත ලබා නොදීම හා අදාල වත්කම් ඉවත් කරන ලද අංශයන්ද වෙන් වෙන්ව පැහැදිලිව දක්වා නොතිබීම හේතුවෙන් එම වත්කම් නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි විය.

(ඌ) විගණන නියැදි පරීක්ෂාවට අනුව රු.4,558,836 ක් වටිනා 2023 වර්ෂයේ කල වැඩ ගිණුමෙන් ඉවත් කරන ලද ලැප්ටොප්, ඩෙස්ක් ටොප් පරිගණක සහ පරිගණක උපාංග වැනි ස්ථාවර වත්කම් අයිතම 50 ක් 2022 වර්ෂයේ හෝ 2023 වර්ෂයේ ස්ථාවර වත්කම් සමීක්ෂණයන්හි පොදු 66 හෝ පොදු 47

ආකෘතියෙහි ඇතුලත්ව නොතිබීම හේතුවෙන් එම වත්කම් සිගාස් වැඩසටහන මගින් පවත්වාගෙන යනු ලබන වාර්තාවෙහි මෙන්ම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත්ව තිබූ බව තහවුරු නොවීය.

(එ) 2023 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන්හි වැඩහල 04 හි ආයුධ සමීක්ෂණ වාර්තාවන්හි තත්‍ය අගයන් ඇතුළත් කර නොතිබුණු අතර "සී" අංශයෙහි රු.5,947,315 ක් වටිනා තොග අයිතම 288 ක් සහ "ජී-ඔයිල්" අංශයෙහි රු.1,967,868 ක් වටිනා තොග අයිතම 16 ක් සත්‍යාපනය කර නොතිබුණි.

(ඒ) 2018 වර්ෂයේදී මිලට ගත් රු.459,946 ක් වටිනා ලි බඩු අයිතම 6 ක් දෙපාර්තමේන්තුවේ පිරිවැය ඒකකයෙන් ඉවත් කල බවට දක්වා තිබුණු අතර එම අයිතම කවරේද යන්න නිශ්චිතව දක්වා නොතිබුණි. එමෙන්ම භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් වායුසමීකරණ, විදුලි පංකා ආදී වත්කම්වල වර්ෂය ආරම්භයේ සහ අවසානයේ ශේෂයන් අතර අඩුවීමක් තිබුණද එම වත්කම් 2023 වර්ෂයේ ඉවත් කරන ලද වත්කම් තුල ඇතුළත්ව නොතිබුණි.

(ඔ) වර්ෂ ගණනාවක් තුල වලනය නොවී පැවති රු.3,933,070 ක තොග වටිනාකමක් විගණනය විසින් හඳුනා ගනු ලැබූ අතර ඉන් රු.1,547, 523ක් වටිනා තොග අවුරුදු 10 ක් තුල වලනය නොවී පැවතිණි.

(ඕ) වටිනාකම රු.455,261 ක් වූ තොග විනාශ කල යුතු බවට 2022 භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනා ගෙන ඇතත් මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ක) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව 2008 හා 2009 වර්ෂවල පැවති ණයගැති ශේෂවල එකතුව රු.36,941,553 ක් වූවද ලියා හැරීම් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිත කමිටු වාර්තාව ප්‍රකාරව එම ණයගැතියන්ගේ එකතුව රු.4,045,992 ක් විය. එසේ නිබියදී මූල්‍ය ප්‍රකාශයන්හි 2008 හා 2009 වර්ෂයන්ට අදාළ ඉහත ඇඳහන් රු.36,941,553 ක් වූ මුළු ශේෂයම කපාහැර තිබුණි.

(ග) මෙම වාර්තාවේ 3.2 (ආ) යටතේ සඳහන් කර ඇති ඌන උපයෝජිත වත්කම් වසර ගණනාවක සිට අව්වට වැස්සට නිරාවරණව දිරාපත් වෙමින් පැවත එන අතර මෙම වාහන, යන්ත්‍ර සූත්‍ර යනාදිය විශාල ප්‍රමාණයක් ගිණුම් ගතවී ඇති බවට සාක්ෂි විගණනය වෙත ලැබී නොතිබුණි.

1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු හා ශේෂයන් සම්බන්ධයෙන් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

අයිතමය	වටිනාකම	සාක්ෂි නොවීම
	රු.	
සෘජු ගැණුම්	3,495,038	
විවිධ වියදම්	1,798,386	
ක්ෂය සංචිත අරමුදල	1,682,924	විස්තරාත්මක උපලේඛන
ලියාහරින ලද ණයගැතියන්	53,161,909	අදාල අනුමැතීන්
බාහිර පාර්ශන්වයෙන් ලබාගත් සේවා වියදම්		
- ව්‍යාපෘති	8,096,087	විස්තරාත්මක උපලේඛන
- ව්‍යාපෘති නොවන	278,829	විස්තරාත්මක උපලේඛන

1.6.6 ලේඛණ හා පොත්පත් පවත්වා නොතිබීම

ලේඛණ වර්ග	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණය
හානිපාඩු ලේඛණ	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන	යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.
බැරකම් පිළිබඳ ලේඛණය	මුදල් රෙගුලාසි 445 හි විධිවිධාන	යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.
ස්ථාවර වත්කම් ලේඛණය	මුදල් රෙගුලාසි 502 (2) හි විධිවිධාන	යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.
තොග ලේඛණ	මුදල් රෙගුලාසි 751 හි විධිවිධාන	යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2023 හි 3.3 ඡේදය අනුව සහ මුදල් රෙගුලාසි 94 (2),(3) අනුව එළඹෙන ලද බැඳීම් සහ වගකීම් වෙන වෙනම හෙළිදරවු කල යුතු වුවත් ,දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තුවේ 4 වන මහල නවීකරණය, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පරණ ජනමාධ්‍ය සංකීර්ණය නවීකරණය වැනි බාහිර පාර්ශවයන් සමග ගිවිසුම්වලට් එළඹ තිබියදීත් බැඳීම් නොමැති බවට සඳහන් කර තිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	

i.	මුදල් රෙගුලාසි 504 (1)	කළ වැඩ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් එක් එක් කාර්තුව අවසානයේදී වෙළඳ ණයගැතියන්, ණයහිමියන්, නිමි භාණ්ඩ, අමු ද්‍රව්‍ය, ගබඩා භාණ්ඩ හා සැපයුම්, අත්තිකාරම් ගිණුම් සඳහා නියමිත සීමාවන් පිළිබඳ ප්‍රකාශයන් පිලියෙල කොට විගණකාධිපතිවරයාටද පිටපතක් සහිතව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කර නොතිබුණි.
ii.	මුදල් රෙගුලාසි 504 (2)	එක් එක් කාර්තුව අවසානයේදී අවස්ථානුරූප ලාභාලාභ ගිණුමක් පිළියෙල කර කාරකපාඩු පියවීම සම්බන්ධයෙන් වූ ප්‍රතිපාදන සලසා ගැනීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් යොදාගත යුතු වූවද එලෙස ගිණුමක් පිලියෙල කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත විගණකාධිපතිවරයාටද පිටපතක් සහිතව ඉදිරිපත්කර නොතිබුණි.
iii.	මුදල් රෙගුලාසි 505	සෑම මසකට වරක්වත් තොග සහ බඩු බාහිර ආදිය විෂයයන් කිහිපයක් ඒවාට අදාළ තොග ලෙජර ශේෂයන් සමඟ සම්පූර්ණ භෞතික සත්‍යාපන පිරික්සුමකට භාජනය කළ යුතු වූවද එසේ සිදුකර නොතිබුණි.
iv.	මුදල් රෙගුලාසි 571	ඉකුත් වූ තැන්පතු පිලිබඳව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි.

v.	මුදල් රෙගුලාසි 756 (6)	පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කොට 2022 අපහරණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.
vi.	මුදල් රෙගුලාසි 1645	පවත්වා ගතයුතු ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.
vii.	මුදල් රෙගුලාසි 756	පොදු 66 හි ආයතනය සතුව පවතින භාවිතා කළ හැකි භාණ්ඩ සහ පොදු 47 හි ආයතනය සතු ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සටහන් කල යුතු වුවද පොදු 66 හි ඇතුලත් භාණ්ඩ පොදු 47 හිද ඇතුලත්ව ඇති බව නිරීක්ෂණය විය.
(ආ)	භාණ්ඩාගාර ලේකම්ගේ අංක MF/CG/02/(iv) හා 2017.06.28 දිනැතිව නිකුත් කර ඇති 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය.	වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම යටතේ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට යැවිය යුතු තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	
	i. 8 වන වගන්තිය	රුපියල් පන්ලක්ෂය් ඉක්මවූ භාණ්ඩ කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කළ යුතු වුවත් එම විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.
	ii. 8.8.1 (අ) වගන්තිය	අසාර්ථක වූ ලංසුකරුවන් වෙත එම ලංසුකරුගේ විශේෂ අඩු පාඩු පෙන්නුම් කරමින් ලංසුව අසාර්ථක වීමට හේතු දැනුම් දී නොතිබුණි.

2.4 තැන්පතු

වසර දෙකකට වඩා වැඩි කාලයක් තුල නිරවුල් නොවූ ටෙන්ඩර් තැන්පතු ශේෂය රු.1,037,461 ක් වූ අතර එම ශේෂයන් සම්බන්ධයෙන් මු.රෙ.571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 දැක්ම හා මෙහෙවර

යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම සඳහා "ඒ" පංතියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් රජයේ 1971 ජනවාරි 10 දින ස්ථාපනය කර ඇති රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ දැක්ම තිරසාර සංවර්ධනය තුලින්, ඉදිරි ශ්‍රී ලාංකීය යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ, නිෂ්පාදන, සේවා සහ පුහුණුව සපයන විශිෂ්ඨතම රාජ්‍ය ආයතනය බවට පත්වීම විය. දෙපාර්තමේන්තුවේ කාර්යයන් නිෂ්පාදන ක්ෂේත්‍රය, ඉදිකිරීම් ක්ෂේත්‍රය (බර වැද්දුම්), අළුත්වැඩියා සහ නඩත්තු ක්ෂේත්‍රය සහ යාන්ත්‍රික ඉංජිනේරු උපදේශාත්මක සේවා යන ක්ෂේත්‍රයන් 04 ක් යටතේ විහිදී ඇත.

3.1.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

(අ) ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති ඉටුකරලීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් නොවුවද ජන මාධ්‍ය අමාත්‍යාංශයේ පැරණි මැදිරි සංකීර්ණය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ඉටුකිරීමේ කොන්ත්‍රාන්තුව භාරගෙන 2019 අගෝස්තු 26 දින ප්‍රුවත්පත් දැන්වීම් පලකර විවෘත ලංසු කැඳවා රු.16,510,934 ක (වැට් රහිත) කොන්ත්‍රාත් අගයකට බාහිර කොන්ත්‍රාත්කරුවකු වේත පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

i. මෙහිදී ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව යටතේ ඇති සමාගමක්ද (REDECO) රු.14,376,520 ක අගයකටත් වෙනත් පෞද්ගලික සමාගමක් රු.16,510,934 ක අගයකටත් ලංසු ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය නියමිත දිනට අළුත් නොකිරීම හේතුවෙන්, ඒ පිළිබඳ විමසීමකින් තොරව 2019 සැප්තැම්බර් 06 දින රැස් වූ තාක්ෂණික ඇගයුම් කමිටුව අඩුම මිළගණන් ඉදිරිපත්කල REDECO සමාගම ප්‍රතික්ෂේප කර පෞද්ගලික සමාගම තෝරාගෙන තිබුණි. එසේ වුවද 2013 අගෝස්තු මස 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 13/1114/503/085 අනුව සාමාන්‍ය ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව රු. මිලියන 30 දක්වා වූ කොන්ත්‍රාත්තු රෙඩෙකෝ (REDECO) සමාගම වෙත ලබා දීමට රාජ්‍ය ආයතනවලට බලය පවරා තිබුණි.

ii. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් සඳහා විධිමත් ආකෘතිපත්‍ර වලට අනුකූල වූ විධිමත් කොන්දේසි සහිත ගිවිසුමකට ඇතුලත් විය යුතු වූවත් 2019 සැප්තැම්බර් 25 දින කොන්ත්‍රාත්කරු සමඟ එළඹ තිබූ ගිවිසුමෙහි එවැනි නීත්‍යානුකූලභාවයක් නොතිබුණි.

iii. කොන්ත්‍රාත්කාර සමාගම විසින් එක් එක් අයිතමයන්ට එවා තිබූ රේටයන් හා ඉංජිනේරු ඇස්තමේන්තුව අතර 8 % සිට 409 % දක්වා විචලතාවයක් දක්නට විය. මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුගෙන් හේතු පැහැදිලි කරවා ගැනීමට රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

iv. මෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කල මුල් අවස්ථාවෙහි සිටම ප්‍රමාණ පත්‍රයෙහි (BOQ) නොමැති අයිතම සඳහන් කරමින් රු.7,401,993 ක වටිනාකමකින් යුත් විශේෂ රේටයන් (Special Scheduled Rate) 62 ක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර ඉන් රු.5,822,041ක් එනම් මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 35 ක් සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණි.

v. මෙසේ නවීකරණය කරන ලද ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ගොඩනැගිල්ල වැහි දිනවල ජලයෙන් පිරී යන බැවින් වර්තමානයේ භාවිතයට ගත නොහැකි තත්ත්වයක පැවතුණි. එවැනි තත්ත්වයකදී කාර්යසාධන බැඳුම්කරය නිදහස් කිරීම සඳහා 2022 පෙබරවාරි 23 දින කොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉල්ලීම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර තිබුණි.

vi. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 (අ) අනුව කොන්ත්‍රාත්කරුවකුට ගෙවිය යුතු සෑම ගෙවීමකින්ම නිශ්චිත මුදලක් රඳවා තබා ගැනීමේ මුදලක් ලෙස ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් රඳවා තබාගත යුතු වූවද එසේ තබාගෙන නොතිබුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) රජයේ කර්මාන්තශාලාවේ එතෙක් පැවති පැරණි පරිගණක මෘදුකාංග පද්ධතියෙහි දුර්වලතා හේතුවෙන් අක්‍රමවත්ව ක්‍රියාත්මක වූ තොග පාලනය, තොග ඇණවුම් කිරීම, මිලදී ගැනීම, ඇස්තමේන්තු සැකසීම ආදී කටයුතු නිසියාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා පැවති පද්ධතිය වැඩි දියුණු කිරීම වෙනුවෙන් 2021 වර්ෂයේදී මිල ගණන් කැඳවා පෞද්ගලික සැපයුම්කරුවකු තෝරාගෙන අදාල සැපයුම්කරු වෙත රු.2,954,700 ක් 2021 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

i. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3 (ඇ) අනුව ලංසු කැඳවීමට පෙර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු කැඳවීමේ ලේඛන පරීක්ෂා කොට අනුමත කළ යුතු බවට දක්වා තිබුණද තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කර තිබුනේ ද ලංසු විවෘත කිරීමෙන් පසුවයි.

ii. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) අනුව කිසිම සාමාජිකයකු ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව යන කමිටු දෙකෙහිම නොසිටිය යුතු බවට දක්වා තිබුණද, මෙහි එක් නිලධාරියකු කමිටු දෙකෙහිම සේවය කර තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) අනුව විෂයය පිලිබඳ විශේෂඥයින්ගෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව සමන්විත විය යුතු වුවද එවැනි සාමාජිකයින් පත් කරගෙන නොතිබුණි.

iii. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පත් කරනු ලැබිය යුතු වුවත් මෙම පද්ධතිය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර තිබුනේ යාන්ත්‍රික ඉංජිනේරු - සැපයුම් විසිනි.

iv. යලි ඇනවුම් මට්ටමේදී ගබඩා ඇනවුම ස්වයංක්‍රියව නිර්මාණය වී අනුමැතිය සඳහා ඉදිරිපත්වන බවට පිරිවිතරයන්හි දක්වා තිබුනද අතින් ලියන ලද ගබඩා ඇනවුම් මිලට ගැනුම් අංශයට ඉදිරිපත් වන බව විගණිත දින වූ 2024.03.01දින විගණනයට නිරීක්ෂණය විය. තවද ඇස්තමේන්තු වටිනාකම් පද්ධතියෙන් නිර්මාණය කිරීමට පහසුකම් සලසා දෙන බවට පිරිවිතරයෙහි දක්වා තිබුණද 2023 වර්ෂය සඳහා ලබා දෙන ලද සමුච්චිත වැඩ සාරාංශ වාර්තාවෙහි ඇස්තමේන්තු ගත ද්‍රව්‍ය සහ ශ්‍රම පිරිවැය දක්වා නොතිබුණි. මේ හේතුවෙන් සත්‍ය වියදම හා ඇස්තුමේන්තුගත වියදම අතර විචලතාවයක් පවතින්නේ කාර්යය පත්‍රයක අමුද්‍රව්‍යද, ශ්‍රමයද නැතහොත් අනෙකුත් පොදු කාර්යය වියදම් වලින්ද යන්න තහවුරු කරගත නොහැකිවිය.

v. 2023 දෙසැම්බර් 31 දිනට FMS පද්ධතිය මඟින් ජනනය වෙන් තොග ශේෂයන් සම්බන්ධ තොරතුරු විගණනය විසින් ඉල්ලා සිටියද යවත්කාලීන කරන ලද ඒවැනි වාර්තාවක් පද්ධතිය හරහා ජනනය කර ලබා නොදුන් අතර ගිණුම් අංශය විසින් පිලියෙළ කර ලබා දුන් තොග වාර්තා විගණනයට ඉදිරිපත් කෙරුණි. එමෙන්ම වාර්තාවේ අයිතමවල සියළුම විස්තර සඳහන් කර ඇතත් කිසිදු දිනයක් හෝ කාල පරාසයක් අදාළ වාර්තාවේ ඇතුලත්ව නොතිබුණි. තවද කර්මාන්තශාලා කළමනාකරණ පද්ධතියෙන් ලබා ගත් තොග වාර්තාවෙහි රු.1,723,305 ක් වටිනා අයිතම් 04 ක සෘණ අගයන් සටහන් වී තිබුණු අතර එම ශේෂයන් තොග පොත් අනුව සොයාගත නොහැකි විය.

3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) කැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද රු.104,412,899 ක් වූ ඇස්තමේන්තුවට කැපැල් දෙපාර්තමේන්තුව එකඟවී 2018 දෙසැම්බර් 31 දින රු.3,795,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද අදාළ ඉදිකිරීමට යෝජිත ඉඩමෙහි පස සුදුසු නොවන බව 2019 ජනවාරි 13 දින පැවති සාකච්ඡාවේදී තහවුරු වී තිබුණු බැවින් අළුතින් සකස් කරන සැලසුමකට අනුව වෙනත් ස්ථානයක ඉදිකිරීමකට යැයි දක්වා තවත් රු.10,710,572 ක් 2019 මාර්තු 14 දින හා රු.7,694,000ක් 2020 මාර්තු 06 දිනද ලෙස එකතුව රු.22,199,572ක් මෙම දෙපාර්තමේන්තුවට කැපැල් දෙපාර්තමේන්තුවෙන් අයකරගෙන තිබුණි. එසේ වුවද 2023 දෙසැම්බර් 31 දිනටද ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සියයට 10 ක් පමණක් විය. වසර 05 ක් ගත වූවද ව්‍යාපෘතිය නිමකර දීමට හෝ ලද මුදල් ආපසු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ආරක්ෂක සේවය සඳහා 2023 මැයි මාසයේ ජාතික තරහකාරී මිල කැඳවුම් ක්‍රමය ඔස්සේ මිල ගණන් කැඳවා පෞද්ගලික ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 අනුව කිසිම සාමාජිකයකු ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව යන දෙකෙහිම සේවය නොකළ යුතු වුවත් ඊට පටහැනිව කමිටු දෙකෙහිම එක් සාමාජිකයෙකු සේවය කර තිබූ බව නිරීක්ෂණය විය.

ii. සතියේ දිනකට දිවා මුරය සඳහා ස්ථානභාර නිලධාරීන් (OIC) 02 ක් සහ කණිෂ්ඨ ආරක්ෂක නිලධාරීන් 31 ක් යෙදවිය යුතු වුවද 2024 අප්‍රියෙල් 01 වන දින සේවයට වාර්තා කර තිබුනේ නිලධාරීන් 09 ක් පමණි. මෙමගින් අවශ්‍ය ස්ථානයන්ට නිසි ආරක්ෂාවක් ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය.

iii. තවද, CCTV කැමරා 68 ක් ස්ථාපිත කර තිබූ අතර ඉන් 09 ක් ක්‍රියා විරහිතව පැවතුණු බව තොරතුරු තාක්ෂණ අංශය දන්වා සිටියද 2023 දෙසැම්බර් 21 දින අධික වර්ෂාපතනය හේතුවෙන් කැමරා 68 න් 30 ක්ම අක්‍රිය බවත්, අංක 05 මුරපොල වර්ෂාපතනය හේතුවෙන් ආරක්ෂක රාජකාරී කල නොහැකි බවත්, වැඩහල 03 හි ප්‍රධාන විදුලි ස්විචය නිරන්තරයෙන් ක්‍රියාවිරහිත වීම හේතුවෙන් CCTV දර්ශන ලබා ගත නොහැකි බවත් ආරක්ෂක නිලධාරීන්ගේ ලොග් සටහනෙහි දක්වා තිබුණි. මේ හේතුවෙන් CCTV යන්ත්‍ර සවි කිරීමේ අරමුණ ඉටු නොවීමත් ආරක්ෂක නිලධාරීන් නියමිත

සංඛ්‍යාව අවශ්‍ය තැන්හි යොදවා නොමැති අවස්ථාවලදීත් විවිධ අක්‍රමිකතා ඇති වීමේ අවධානමක් නිරීක්ෂණය විය.

(ඇ) නිල නිවාස පවත්වාගෙන යාම

i. රජයේ කර්මාන්තශාලීය සංහිඳ සෙවණ මහල් නිවාසයන්හි පවත්නා අක්‍රමිකතා සම්බන්ධයෙන් අනෘජ්තියට පත් සංහිඳ සෙවණ මහල් නිවාසයන්හි පදිංචි දෙපාර්තමේන්තු සේවකයන් විසින් පොලිස්පතිතුමාටද පිටපතක් සහිතව මාධ්‍යයක් වෙත යොමු කර තිබූ ලිපියකට අනුව, විශ්‍රාම ගිය නිලධාරීන් රාජ්‍ය නිවාස භාවිත කිරීම, විදේශගත වීමෙන් පසුවද පදිංචිව සිටීම, රජයේ නිවාස වෙනත් බාහිර පාර්ශවයන්ට කුලියට දීම, අයිස් මත්ද්‍රව්‍ය භාවිතය, සේවකයන් වැඩ තහනම්ව තිබියදී නිල නිවාස පරිහරනය කිරීම, සුනඛයන් ඇති කිරීම, නිවාස බලධාරීන් විසින් පරීක්ෂා නොකිරීම යන කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබුණි. මෙම ලිපියට පිලිතුරු වශයෙන් ශ්‍රී ලංකා පොලීසියේ විශේෂ කාර්යය බලකා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් එවන ලද 2023 දෙසැම්බර් 30 දිනැති අංක C/STF/01/out/11207/2023 දරණ ලිපිය විගණනය වෙත ඉදිරිපත් නොවීය.

ii. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ ආරක්ෂක නිලධාරීන් විසින් සිදු කළ භෞතික පරීක්ෂාවේදී ද ඉහත සිදුවීම් වාර්තා කර තිබුණි. එසේ වුවද 2023 නොවැම්බර්10 දින අවසන්වරට රැස්ව තිබුණු නිවාස කමිටුව විසින් නිවාස 26 ක් පමණක් පරීක්ෂාකර තිබූ අතර ඉතිරි නිවාසද පරීක්ෂාකර බලා අවශ්‍ය ක්‍රියාමාර්ගය ගැනීමට කටයුතු කිරීමට 2024 අප්‍රේල් 01 විගණිත දිනය වන තෙක්ම අපොහොසත් වී තිබුණි.

iii. දෙපාර්තමේන්තුවේ සිට පිටතට මාරු වී ගිය නිලධාරියෙකු පදිංචිව සිටි 21/18 දරණ නිවසේ ගිවිසුම්ගත කාලය 2023 පෙබරවාරි 11 දිනෙන් අවසන් වී ඇති අතර නිලධාරියා මේ වන තෙක්ම අදාළ නිවස භාරදීමට කටයුතු කර නොතිබුණි. ආයතන අංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 7.2 වගන්තිය අනුව ඔහුගෙන් අයවිය යුතු දන්ඩණ කුලිය හා විවෘත වෙළඳපොල කුලිය යන දෙකේ එකතුව ලෙස රු.679,851 ක් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවතුණි.

(ඈ) රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික උත්සවයන් වෙනුවෙන් වේදිකා ඉදිකිරීමේ කාර්යය රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන අතර 2023 වර්ෂයේදී ද මේ සඳහා රු.54,164,000 ක් වටිනා බිල්පත් ඉදිරිපත් කර අදාල වැය ශීර්ෂයට හර කර තිබුණි.

එසේ වූවද මේ සඳහා යොදාගනු ලද GI පයිප්ප ,H අයන්, අමානෝ තහඩු කාප්ප,කොවි කණු ආදී නොයෙකුත් අමුද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මීට පෙර වසර වලදී මිළදී ගෙන තවමත් තිත්ත ආලේපකර භාවිතයට ගනු ලැබේ. මෙම තොග සම්බන්ධ කිසිදු තොග ලෙජරයක් ගබඩාවන්හී පවත්වාගෙන නොයන අතරම මෙම තොගය කොපමණ ප්‍රමාණයක්ද යන්න තහවුරු නොවීය.

3.2 වත්කම් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුවට අයත් කොළොන්නාව පිහිටි නිල නිවාස 24 ක් එම නිවාසයන්හි නානකාමර වල ජලය කාන්දුවීම අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් පාවිච්චි නොකර ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තු පරිශ්‍රයේ එළිමහනේ කිසිදු ප්‍රයෝජනයක් නොගෙන අවිවට වැස්සට නිරාවරණව දිරාපත් වෙමින් වසර ගණනාවක සිට පැවතෙන එන වටිනා වාහන, යන්ත්‍ර සූත්‍ර යනාදිය විශාල ප්‍රමාණයක් නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම වත්කම් මු.රෙ.445 ප්‍රකාරව ඉන්වෙන්ට්‍රිගත වී ස්ථාවර වත්කම් ලේඛණයන්හි ඇතුලත් වී ඇත්ද, ඒවායෙහි වටිනාකම් කවරේද, හඳුනාගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර භාණ්ඩ සමීක්ෂණයන්හි මේ පිළිබඳ වාර්තා වී නොතිබුණු අතර මේ හේතුවෙන් මු.රෙ.756 ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණයන් සිදුකරන බව විගණනයට පිළිගත නොහැකි විය.

(ඇ) විකිණීම සඳහා දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනය කරනු ලැබූ යන්ත්‍ර හා නොයෙකුත් උපාංග විකුණා ගැනීමකින් තොරව ගබඩාවන්හි මළකඩ කමින් ගබඩාවන්හි රඳවාගෙන තිබෙනු භෞතික පරීක්ෂාවන්හීදී විගණනයට නිරීක්ෂණය විය.

දෙපාර්තමේන්තුවේ අලෙවි අංශය විසින් මෙම භාණ්ඩ සඳහා කිසිදු ප්‍රචාරණයක් ලබා නොදෙන බවත් ප්‍රදර්ශනාගාරයක් ලෙස ඉදිකර ඇති ගොඩනැගිල්ල විගණනය විසින් පරීක්ෂා කරනු ලබන අවස්ථාවේදීත් වසාදමා තිබෙනු නිරීක්ෂණය විය. එමෙන්ම මෙම ප්‍රදර්ශනාගාරය මහාමාර්ගයෙහි ගමන් කරනු ලබන කිසිදු පුද්ගලයෙකුට එකවර හඳුනාගත හැකි, ආකර්ශණීය ස්ථානයක් නොවන බවත් දෙපාර්තමේන්තුව සතුව ඇති වටිනා ඉඩම් වත්කම්න්ද මෙවැනි ආකාරයේ කිසිදු ප්‍රයෝජනයක් ගැනීමට ක්‍රියාකර නොමැති බව නිරීක්ෂණය විය.

(ඈ) රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ලේ 4 වන මහල පාටිෂන් කිරීම, සුදුසු පරිදි විදුලි පද්ධතිය සැකසීම සහ වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීම.

2019 මැයි 12 දිනැති අංක MH CCA/MC/2019/33 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2019 ජූනි 04 දින ලත් අනුමැතිය අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ආයතනවල ස්ථාවර තාක්ෂණික කමිටුවේ අනුමත රේටයන් අනුව අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මගින් ඉදිකිරීම් කාර්යයන් ඉටුකරවාගත යුතු බව දන්වා තිබුණි. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ සලකා බලන ලද සුළු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම කොන්ත්‍රාත්තුව රු.5,571,586 (වැට් සහිත) ක අගයකට ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය (NEMO) මගින් ඉටු කරවා ගැනීමට 2019 නොවැම්බර් 20 දින දෙපාර්ශවය විසින් අවබෝධතා ගිවිසුම අත්සන් කර තිබුණි. මේ සඳහා 2020.02.16 දින වන විට මුළු ගෙවීම් රු.3,659,123 ක් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය (NEMO) වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

i. 2020.02.13 දින ප්‍රසම්පාදන කමිටු විසින් මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයෙහි වලංගු කාලය මාස 06 න් එනම් 2019.12.06 දින අවසන් වී ඇති බැවින් විදුලි අළුත්වැඩියාව NEMO මගින් සිදු කිරීම අනුමත නොකරන ලද අතර මෙම කාර්ය නැවත මිල කැඳවා හෝ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩල යොදවා ඉටු කර ගැනීම සුදුසු බව තීරණය කරන ලදී. ඒ අනුව රු.3,659,124 වියදම් දරමින් මෙම පාටිෂන් කාර්යය ඉටු කර තිබුණ නමුත් 2024 ජනවාරි වන විටත් කාර්යාල පරිශ්‍රය නිශ්කාර්යව පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

ii. මෙම පාටිෂන් කරන ලද කොටස සඳහා වායුසමීකරණ යන්ත්‍ර 8 ක් මිලදී ගෙන ඇති අතර 2020 ජනවාරි 27 දින අබානස් ආයතනය සමඟ සේවා ගිවිසුම් සඳහා ඇතුලත් වී තිබුණි. මෙම වායු සමීකරණ යන්ත්‍ර 8ක් සඳහා ලබාදී ඇති වගකීම් සහතික වල මිලදී ගත් දිනයන් සඳහන් කර නොමැති අතර වගකීම් සහතික වල මුල් පිටපත් විගණනය වෙත ඉදිරිපත් වූ ලිපිගොනු තුල නොවීය.

(ඉ) මායිම් තාප්ප හෝ ස්ථීර වැටක් යොදා දෙපාර්තමේන්තුව සතු ඉඩම් ආරක්ෂා කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් රජයේ කර්මාන්තශාලා සේවක නිවාස පිහිටි ඉඩමේ ඌන උපයෝජිතව පවතින ඉතිරි අක්කර 01 යි රූඩ් 03 යි පර්චස් 11ක භූමි භාගය අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කරගෙන තිබුණි.

(ඊ) රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පිහිටි ඉඩමද ඇතුළුව දෙපාර්තමේන්තුව සතු එකතුව අක්කර 24 රූඩ් 01 පර්චස් 1.87 ක් වූ ඉඩම් තුනක් වෙනුවෙන් ඔප්පු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණු අතර මිනින්දෝරු සැලැස්ම පදනම් කරගෙන ප්‍රාදේශිය ලේකම් මඟින් අයිතිය තහවුරු කරගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(උ) මෙන්දිස් වත්තේ සේවක නිවාස 03 ක් පිහිටි ඉඩමේ අක්කර 01 රූඩ් 03 පර්චස් 11ක ඉතිරි භූමි ප්‍රදේශය නිශ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

4. මානව සම්පත් කළමනාකරණය

2023 දෙසැම්බර් 31 දිනට අනුමත, තත්‍ය, පුරප්පාඩු කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. 88,317,269 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.276,857 ක් වී තිබුණි.

මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	31	17	14
තෘතියික	10	02	08
ද්විතියික	282	131	151
ප්‍රාථමික	446	169	277
එකතුව	**769**	**319**	**450**

තනතුරු 450 ක පුරප්පාඩු පිරවීමට හෝ අවශ්‍යතාවයන්ට අනුව තනතුරු සංඛ්‍යාව සංශෝධනය කරගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

එච්.ඒ.ඩී.චාන්දනී අබේසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
කළ වැඩ අත්තිකාරම්			√
ප්‍රාග්ධන වියදම්		√	

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
පිරිසුදු ජලය හා සනීපාරක්ෂාව	100%				√
පුනර්ජනනීය බල ශක්තිය භාවිතය	100%		√		
LED විදුලි ලාම්පු භාවිතය	100%				√

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- විදුලි හා ජල විගණනය සඳහා ගොඩනැගිලි / වැඩහල් සඳහා ජල මීටර්/ විදුලි මීටර් සවි කිරීම.
- Mercury (රසදිය) බල්බ හා CFL බල්බ භාවිතය හා මිල දී ගැනීම අවම කරමින් LED බල්බ / සූර්ය පැනල භාවිතය දිරිගැන්වීම.
- කසළ කළමණාකරණය.
- දිවා කාලයේදී ආලෝකමත් කිරීමට හැකිතාක් සූර්යාලෝකය භාවිතා කිරීම.
- හරිත ගොඩනැගිලි සංකල්පය සඳහා සූදානම් වීම.
- තාප්පය වටා සහ ඇතුලත සූර්ය බලශක්ති විදුලි ලාම්පු සවි කිරීමට කටයුතු කරමින් පවතී.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	31	17	15
තෘතියික	10	02	08
ද්විතියික	282	131	152
ප්‍රාථමික	446	169	277
එකතුව	**769**	**319**	**452**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය / අතිරික්තයේ බලපෑම

- ප්‍රාථමික ශ්‍රේණිවල කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 446 ක් වන අතර 277 ක පුරප්පාඩු සංඛ්‍යාවක් පවතී.
- විධායක හා ද්විතික ශ්‍රේණිවල නිලධාරී ඌණතාවය හේතුවෙන් විෂයන් කීපයක් භාර දී ඇත. එහිදී ඒ ඒ කාර්යයන්හි කාර්යක්ෂමතාවයට බලපෑම් සිදු වී ඇත.
- එකවර ව්‍යාපෘති කීහිපයක කටයුතු කිරීමට සිදුවීමේදී, කාර්ය මණ්ඩල ඌනතාවය, මහත් බලපෑම් ඇති කරයි.
- පවත්නා නිෂ්පාදන කාර්යයන්ට හා ප්‍රාථමික ශ්‍රේණිවල නිලධාරීන්ට වැටුප් හා වේතන ගෙවනු ලබන්නේ දෙපාර්තමේන්තු කළ වැඩ අත්තිකාරම් ගිණුමෙන් වන බැවින් එම මූල්‍ය ශක්තිය ද සලකා බලා බඳවා ගැනීම් කරනු ලැබේ.

6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වූ ආකාරය 2023

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)	පුහුණු කිරීම් වර්ගය (දේශීය,විදේශීය)	පුහුණුවෙන් පසු ලබා ගත් දැනුම
1.	මිනුම්	49	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
2.	කර්මාන්තශාලා ආඥා පනත	37	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
3.	ගබඩා සමීක්ෂණ	43	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
4.	රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති	25	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
5.	E – GP System	17	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
6.	සංවිධාන ඵලදායිතාව	31	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
7.	මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය	197	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
8.	නිවාඩු හා පෞද්ගලික ලිපිගොනු	201	දින 04	0.00	දේශීය	සතුටුදායකයි
9.	3D Printing	20	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
10.	වාහන නඩත්තුව	80	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
11.	Drawing	10	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
12	පංචවිධ සංකල්පය	157	දින 04	0.00	දේශීය	සතුටුදායකයි
13	Word & Excel	11	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
14	NVQ දැනුවත් කිරීම	67	දින 01	0.00	දේශීය	සතුටුදායකයි

2023 වර්ෂය සඳහා පුහුණු වැඩසටහන් වෙනුවෙන් මිලියන 1.8ක ප්‍රතිපාදන අනුමත වී තිබූ අතර වැය ශීර්ෂ 310-2-1-0-2401 යටතේ 2023 වර්ෂයේ පහත පරිදි ප්‍රතිපාදන මිලියන 1.8න් 94%ක ප්‍රමාණයක් වියදම් සිදු කරන ලදි.

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)	පුහුණු කිරීම් වර්ගය (දේශීය,විදේශීය)	පුහුණුවෙන් පසු ලබා ගත් දැනුම
1.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය	1	පැය 70	25,000.00	දේශීය	සතුටුදායකයි
2.	විගණන පනත හා විගණන ගැටළු නිරාකරණය කිරීම	3	පැය 06	18,000.00	දේශීය	සතුටුදායකයි
3.	Primavera P6 Project Management	15	පැය 40	262,500.00	දේශීය	සතුටුදායකයි
4.	CNC Part Programing using Solid CAM	2	පැය 80	104,000.00	දේශීය	සතුටුදායකයි
5.	PG Dip in Manufacturing	1		302,500.00	දේශීය	සතුටුදායකයි
6.	Lead Auditor Course	1		86,400.00	දේශීය	සතුටුදායකයි
7.	NVQ සහතිකය ලබා ගැනීම සඳහා වැය වූ මුදල ප්‍රතිපූර්ණය කිරීම	1		6,500.00	දේශීය	සතුටුදායකයි
8.	Solid Work	1	පැය 80	45,000.00	දේශීය	සතුටුදායකයි
9.	Payroll System	1	පැය 18	18,000.00	දේශීය	සතුටුදායකයි
10.	Foundry Training	7	පැය 8	10,500.00	දේශීය	සතුටුදායකයි
11.	(TVEC) NVQ 03 MMAW පාඨමාලාව	1			දේශීය	සතුටුදායකයි
12.	දෙමළ භාෂා පුහුණුව	35	පැය 150	112,500.00	දේශීය	සතුටුදායකයි
13.	Construction Equipment maintenance program	1	පැය 40	7,500.00	දේශීය	සතුටුදායකයි
14.	Data visualization and Analytics power	1	පැය 06	10,000.00	දේශීය	සතුටුදායකයි
15.	Welding training at Sri lanka atomic energy board	2	පැය 40	214,551.99	දේශීය	සතුටුදායකයි
16.	Advance Excel	1	පැය 10	7,000.00	දේශීය	සතුටුදායකයි
17.	Thermography testing Workshop	3	පැය 14	43,319.04	දේශීය	සතුටුදායකයි
18.	Diploma In Quality Management one year Part time(Sri Lanka Standards Institution (SLSI)	1	පැය 240	147,436.00	දේශීය	සතුටුදායකයි
19.	General Fitter NVQ-04 Assessment fees	6		48,000.00	දේශීය	සතුටුදායකයි
20.	6 Sigma	1		180,000.00	දේශීය	සතුටුදායකයි
21.	Foundry technician NVQ -04 Assessment fee	7		66,500.00	දේශීය	සතුටුදායකයි

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල වේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.9	භාණ්ඩ පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍ර ලේඛ 1-2019ට වැඩිමනක් වශයෙන් DMA/AMC/M/2021/2 හා 2021/08/06 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් ලිපිය අනුව රැස්වීම් පැවැත්වීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		

09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව, කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
අංකය	**අදාළ කර ගත යුතු අවස්ථාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම**	**අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනකූල වීම	අනුකූල වේ.		
12.2	හිහහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.		2020 වර්ෂයේ සිට සෑම මසකම ශේෂයන් පරීක්ෂා කර ඒවා පියවා ගැනීමට කටයුතු කරනු ඇත.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳීම් කිරීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15	**අදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සිමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම , ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධන කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

7.1 අභ්‍යන්තර විගණක වාර්තාව

<u>දැක්ම :</u>

යාන්ත්‍රික ඉංජිනේරුමය නිෂ්පාදන සහිත දෙපාර්තමේන්තුවක මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය විනයෙන් යුත් ඉදිරි ගමනක් සඳහා විගණනය මඟින් අත්වැලක් සැපයීම.

<u>අරමුණු :</u>

දෙපාර්තමේන්තුවේ පවතින මූල්‍යය සම්පත්, මානව සම්පත් ඇතුළු අනෙකුත් ආර්ථික සම්පත් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායිතාවයෙන් යුක්තව මෙන්ම පවතින රාජ්‍ය නීති රීති හා උපදෙස් ප්‍රකාරව දෙපර්තමේන්තුවේ අරමුණු සඳහා යොදවා ගන්නේද යන්න පිළිබඳව සොයා බලා දෙපාර්තමේන්තු ප්‍රධානී වෙත හා අනෙකුත් සම්බන්ධිත විගණන පාර්ශවයන් වෙත වාර්තා කිරීම.

<u>රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ කාර්යභාරය හා වාර්ෂික ප්‍රගතිය - 2023 වර්ෂය</u>

- දෙපාර්තමේන්තුවේ එකිනෙක අංශවල විගණන කටයුතු සිදු කිරීම තුළින් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම හා එමඟින් පවතින ගැටළු අවම කිරීමට කටයුතු කිරීම.
- හදිසි විමර්ශනමය කාර්යයන් ඉටු කිරීම.
- මුදල් අමාත්‍යාංශයේ විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කාර්යයන්
- රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණන අංශය හා රජයේ විගණන අංශය සමඟ සම්බන්ධීකරණ කාර්යයන් සිදු කිරීම.

<u>2023 වාර්ෂික ප්‍රගතිය :</u>

01. 2023 වර්ෂයේ විගණන සැලැස්ම අනුව විගණන වැඩසටහන් 12 ක් සැලසුම් කර තිබුණ ද අභ්‍යන්තර විගණන සැලැස්ම සංශෝධනය කරමින් වර්ෂය තුළ විගණන වාර්තා 11 ක් නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

02. 2023 වර්ෂයේ සිදු කරන ලද විශේෂ විමර්ශන සංඛ්‍යාව 04 කි.

03. **දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම - 2023 වර්ෂය**
2023 වර්ෂයේ සැලසුම් කරන ලද විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 4 ම අදාළ වර්ෂයේ පැවැත්වීමට හැකි විය.

කාර්තුව	පැවැත්වූ දිනය
පළමු කාර්තුව	2023.02.21
දෙවන කාර්තුව	2023.06.22
තෙවන කාර්තුව	2023.08.22
සිව්වන කාර්තුව	2023.11.21

04. **කාර්තුමය ඇගයීම් වාර්තා ඉදිරිපත් කිරීම - 2023 වර්ෂය තුළ .**

කාර්තුව	දිනය
2022/04	2023.01.18
2023/01	2023.05.15
2023/02	2023.07.27
2023/03	2023.10.25

05. **රේඛීය අමාත්‍යාංශ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් සාකච්ඡා සටහන් ප්‍රගතියට අදාළ ආකෘතිමය තොරතුරු ඉදිරිපත් කිරීම - 2023 වර්ෂය**

දිනය
2023.03.15
2023.06.07
2023.09.15
2023.11.15

06. <u>වෙනත්</u>

අභ්‍යන්තර විගණන ඒකකය විසින් ඉහත දක්වා ඇති විගණන වාර්තා නිකුත් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් අඛණ්ඩව පසු විපරම් සිදු කරන අතර අදාළ පාර්ශව වෙතින් ලබාගත් පිළිතුරු ද විශ්ලේෂණය කරමින් අවශ්‍ය නිවැරදි කිරීම් හා මඟ පෙන්වීම් සිදු කර ඇත.

ඒ අනුව 2023 වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා තුළින් අනාවරණය කරන ලද , දෙපාර්තමේන්තු පෞද්ගලික ලිපිගොනු නඩත්තුව. කළවැඩ අත්තිකාරම් ගිණුමේ ණය ශේෂ සැසඳීම්, දෙපාර්තමේන්තු රජයේ නිවාස පද්ධතිය කළමනාකරණය, දෙපාර්තමේන්තු වැඩහල සේවක නිවාඩු ක්‍රමවේදය, දෙපාර්තමේන්තු වවුචර් සන්නිරීක්ෂණය, වැඩහල අංගනයන් තුළ නිෂ්කාර්ය අමුද්‍රව්‍ය , කර්මාන්තශාලීය පරිශ්‍රය හා දෙපාර්තමේන්තු වාහන සංචිතය / වාහන ධාවන කළමනාකරණය යනාදි පැතිකඩයන්ට සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් සිදු කරන ලද අභ්‍යන්තර විගණනයන්ගෙන් පසු සැලකිය යුතු මූල්‍යය හා භෞතික ප්‍රගතියක් සාක්ෂාත් කර ගැනීමට හැකිවිය.

මීට අමතරව විගණන කළමනාකරණ කමිටු රැස්වීම් තුලින් පුරප්පාඩු හා බඳවාගැනීම්, අත්තිකාරම් බී ගිණුමේ ණය ශේෂ, කළවැඩ අත්තිකාරම් ගිණුමේ ණය ගැනි ශේෂ , පැරණි ලිපිගොනු හා විශ්‍රාම සකස් කිරීම් කාර්යයන් , රජයේ නිවාස , දෙපාර්තමේන්තු පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්වල ප්‍රගතිය , ස්ථාවර වත්කම්/ආයුධ හා ගබඩා සමීක්ෂණ කාර්යයන් ,දෙපාර්තමේන්තු වාහන සංචිතය, මූල්‍යය හා ආයතනික ලේඛන නඩත්තුව, බැංකු සැසඳුම්, දෙපාර්තමේන්තු ණය හිමියන් (ගෙවිය යුතු බැරකම්), නොපියවූ තත්කාර්ය අතුරු අග්‍රිම, අභ්‍යන්තර හා රජයේ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමේ ප්‍රගතිය , යනාදිය සම්බන්ධයෙන් අවධාරණය කරමින් අවශ්‍ය මඟ පෙන්වීම් සිදු කිරීමට කටයුතු කර ඇත.